2024

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT



ජනාධිපති කාර්යාලය

சனாதிபதி செயலகம்

Presidential Secretariat

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024



ජනාධිපති කාර්යාලය

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම : ජනාධිපති කාර්යාලය

වැය ශීර්ෂ අංකය : 01

පටුන

	අන්තර්ගතය	පිටු අංකය
01 පරිච්ඡේදය	- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	2
02 පරිච්ඡේදය	- 2024 ප්‍රගතිය හා 2025 ඉදිරි දැක්ම	7
03 පරිච්ඡේදය	- 2024 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය විගණකාධිපති නිරීක්ෂණ (ඇමුණුම 01)	21
04 පරිච්ඡේදය	- කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	27
05 පරිච්ඡේදය	- තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය	65
06 පරිච්ඡේදය	- මානව සම්පත් පැතිකඩ	68
07 පරිච්ඡේදය	- අනුකූලතා වාර්තාව	75

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

දැක්ම

"වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම උදෙසා වන සියලු අරමුණු සහ ඉලක්ක කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීම පිණිස නිවැරදි දිශානතියක් කරා රාජ්‍යය යොමුකිරීම

අරමුණු

i. ගරු ජනාධිපතිතුමන්ගේ දැක්ම යථාර්ථයක් බවට පත්කරලීම සඳහා වඩාත් සඵලදායීව , කාර්යක්ෂමව හා සක්‍රිය ලෙස දායක වීම.

ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා විවිධ අණපනත් මගින් ගරු ජනාධිපතිතුමන් විසින් ක්‍රියාත්මක කළයුතු බවට සඳහන් කාර්යයන් එම නීත්‍යානුකූල ප්‍රතිපාදන වලට අනුකූලව කාර්යක්ෂමව හා අනලස්ව ඉටුකිරීම සඳහා සහාය වීම.

iii. ජනාධිපති කාර්යාලය විසින් ඉටුකරන නියාමන හා සම්බන්ධීකරණ කාර්යයන් ඵලදායීව දියත් කිරීම සඳහා පියවර ගැනීම.

iv. අමාත්‍යාංශ හා විවිධ අංශ වලට අයත් සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම හා අවශ්‍ය පරිදි පහසුකම් සැපයීම.

v. ජනාධිපති කාර්යාලයට අදාළ සියලු කළමනාකරණ ශ්‍රිත සමෝධානයක් සහිතව දියත් කිරීම.

vi. පරිපාලන අවභාවිතාවන් ,අතපසු වීම් හෝ ප්‍රමාදයන් නිසා සිදුවී ඇති මහජන පීඩා/ගැටලු අවම කිරීම.


vii. දිළිඳුබව තුරන් කිරීම හා සංවර්ධන ගැටලු සඳහා අවශ්‍ය උපායමාර්ගික මැදිහත්වීම් සිදුකිරීම.

viii. යාවත්කාලීන දත්ත ප්‍රවේශයක් ඇති කිරීම තුළින් ප්‍රජාව වෙත ප්‍රතිලාභ සැලසීම කාර්යක්ෂමව සිදු කිරීම.


ix. වඩා ඵලදායී අයුරින් රාජ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක වීම සඳහා දායක වීම තුළින් ප්‍රජාව වෙත ප්‍රතිලාභ සැලසීමේ ඉඩ ප්‍රස්තා වැඩි කිරීම.

x. මහජන සුඛසාධනය සහතික කිරීම.

1.4 සංවිධාන සටහන (2024 සැප්තැම්බර් මස දක්වා පැවති)



1.4 සංවිධාන සටහන (2024 ඔක්තෝබර් මස සිට පවතින)



1.5 ජනාධිපති කාර්යාලය යටතේ පැවති ප්‍රධාන අංශ (2024 සැප්තැම්බර් මස දක්වා)

1) ජනාධිපති කාර්යය මණ්ඩල ප්‍රධානී අංශය
2) ජනාධිපති පෞද්ගලික ලේකම් කාර්යාලය
3) ජනාධිපති ලේකම් කාර්යාංශය
4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශය
5) පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු අංශය
6) මානව සම්පත් කළමනාකරණ, පාලන හා ප්‍රවාහන අංශය
7) ආර්ථික කටයුතු අංශය
8) ක්‍රමෝපායික කටයුතු අංශය
9) ආහාර සුරක්ෂිතතා හා යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධන අංශය
10) කෘෂිකර්ම ඵලදායිතා සහ ඉඩම් අංශය
11) ආයතන සම්බන්ධීකරණ අංශය
12) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ ඩිජිටල්කරණ අංශය
13) උතුරු පළාත් සම්බන්ධීකරණ අංශය
14) අභ්‍යන්තර විගණන අංශය
15) ප්‍රජා කටයුතු අංශය
16) ගිණුම් හා මූල්‍ය අංශය
17) නීති කටයුතු අංශය
18) විශේෂ ව්‍යාපෘති අංශය
19) ආර්ථික ස්ථායීකරණ අංශය
20) ජනාධිපති මාධ්‍ය අංශය
21) මහජන සම්බන්ධතා අංශය
22) ජනාධිපති ව්‍යත්තීය සමිති සම්බන්ධතා අංශය
23) ඔම්බුඩ්ස්මන් කාර්යාලය
24) ජනාධිපති අරමුදල
25) ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් අංශය

1.5 ජනාධිපති කාර්යාලය යටතේ පවතින ප්‍රධාන අංශ (2024 ඔක්තෝබර් මස සිට පවතින)

1) මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
2) ජනාධිපති පෞද්ගලික ලේකම් කාර්යාලය
3) මානව සම්පත් කළමනාකරණ අංශය
4) පරිපාලන අංශය
5) ජනාධිපති අරමුදල
6) පාර්ලිමේන්තු සහ අමාත්‍ය මණ්ඩල කටයුතු අංශය
7) පරිපාලන හා විදේශ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු අංශය
8) ප්‍රවාහන ඒකකය
9) ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ හා නවීකරණ ඒකකය
10) අභ්‍යන්තර කටයුතු සම්බන්ධීකරණ ඒකකය
11) පරිවර්තන ඒකකය
12) තැපැල් ඒකකය
13) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ ඩිජිටල්කරණ ඒකකය
14) ගොඩනැගිල්ල, පරිශ්‍ර නඩත්තු ඒකකය

15) ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ ඒකකය
16) ඉංජිනේරු ඒකකය
17) වෛද්‍ය ඒකකය
18) රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ඒකකය
19) ජනාධිපති මන්දිරය
20) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ ව්‍යවස්ථාපිත කටයුතු
21) සංවර්ධන පරිපාලන අංශය
22) උපායමාර්ගික කටයුතු ඒකකය
23) ආහාර සුරක්ෂිතතා සහ ප්‍රතිපත්ති ඒකකය
24) ජනාධිපති මාධ්‍ය අංශය
25) මුදල් හා ආර්ථික කටයුතු අංශය
26) ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන
27) ආදායම් දෙපාර්තමේන්තු ප්‍රතිසංස්කරණ හා නවීකරණ අංශය
28) නීති කටයුතු අංශය
29) ජනාධිපති ලේකම් කාර්යාංශය
30) අභ්‍යන්තර කටයුතු ඒකකය
31) දූෂණ විරෝධී විශේෂ විමර්ශන අංශය
32) ජනාධිපති මාධ්‍ය අංශය
33) මහජන සම්බන්ධතා අංශය
34) පර්යේෂණ සහ සංවර්ධන වාණිජකරණය සඳහා වූ ජාතික මූලපිරීම
35) ගිණුම් සහ මූල්‍ය අංශය
36) ප්‍රසම්පාදන ඒකකය
37) අභ්‍යන්තර විගණන අංශය

1.6 ජනාධිපති කාර්යාලය යටතේ පවතින අරමුදල්

1) ජනාධිපති අරමුදල

1.7 විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ. ව්‍යාපෘතියේ නම: ලෝක ආහාර සහනාධාර වැඩසටහන

ආ. දායක නියෝජිත ආයතනය: එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන

ඇ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම: ඇ.ඩො. 74,871,830.00

ඈ. ව්‍යාපෘති කාලසීමාව: 2023 - 2027

02 පරිච්ඡේදය

2024 ප්‍රගතිය හා 2025 ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය 2024

2024 වර්ෂයේ ජනවාරි මස සිට 2024 සැප්තැම්බර් මස නව රජය බලයට පත්වීම දක්වාත් නව රජය පත්වී 2024 ඔක්තෝබර් සිට 2024 දෙසැම්බර් දක්වා වූ කාලය තුළත් ජනාධිපති කාර්යාලය මූලිකත්වයෙන් සිදු කළ මූලික කාර්යයන් හා ප්‍රගතිය පහත පරිදි වේ.

2.1.1 සංවර්ධන වැඩසටහන්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම්

2024 වර්ෂයේ දී ක්ෂේත්‍ර කීපයක් ඉලක්ක කර ගනිමින්, සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද අතර 2024.09.21 වන දිනයෙන් පසුව නව රජය යටතේ එම ආරම්භ කළ ව්‍යාපෘති අවසන් කිරීම පිණිස උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව, 2024 වර්ෂයේ දී ජනාධිපති කාර්යාලය මූලිකත්වයෙන් සිදු කළ සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

2.1.1.1 විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024

2024 වර්ෂය සඳහා අයවැය යටතේ ක්‍රියාත්මක වූ විමධ්‍යගත අයවැය වැඩසටහන මුදල් අමාත්‍යාංශයේ අංක MF/02/2023 සහ 2023.12.29 දිනැති චක්‍රලේඛයෙහි සඳහන් මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාත්මක වූ අතර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මඟින් ලැබෙන ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් අනුමත වූ පසු ජනාධිපති කාර්යාලයේ වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලබාදෙන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ සම්බන්ධීකරණය හා අධීක්ෂණය ජනාධිපති කාර්යාලය මඟින් සිදු කරන ලදී.

භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2024.12.31 දිනට

භෞතික ප්‍රගතිය			මූල්‍ය ප්‍රගතිය		ප්‍රතිශය
අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව	අවලංගු කළ / ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති සංඛ්‍යාව	වැඩ අවසන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව	අනුමත කළ ප්‍රතිපාදනය (රු. මී.)	වියදම (රු.මී.)	
42,036	1,608	40,428	13,250	12,157.54	91.8%

2.1.1.2 ජනාධිපති කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ වෙනත් ව්‍යාපෘතීන්

මූල්‍ය ප්‍රගතිය **2024.12.31** දිනට

අ. අ	විස්තරය සහ වැය ශීර්ෂය	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)			
		අනුමත ප්‍රතිපාදනය	ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්හි ප්‍රතිපාදන වෙනස්කම්	වියදම	ප්‍රතිශතය (අනුයුක්ත ප්‍රතිපාදනයට වියදම)
1.	වතුකම්කරුවන් සඳහා ඉඩම් අයිතිය ලබාදීම* 001-2-06-022-2509	4,000	1,247.98	856.87	21 %
2.	සංවර්ධන මුලපිරීම් (Development Initiative) 001-2-06-003-2509	10,250	6,252.03	5,776.09	56%
3.	තරුණ අභිවෘද්ධි වැඩසටහන (Youth Development Program) 001-2-06-029-2509	1,000	237.18	241.51	24.2%

*මෙම වැය ශීර්ෂය වතුකරයේ ජීවත්වන ජනතාවට ඉඩම් අයිතිය ලබා දීම මෙන්ම එම ප්‍රජාවට යම් අවස්ථාවන්ට ප්‍රවේශවීමට දැඩිව බාධාවක් වන යටිතල පහසුකම් ගැටලු සහ අවශ්‍යතා වලට විසඳුම් ලබා දීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

2.1.1.3 ජනාධිපති කාර්යාලයීය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ ඍජු ව්‍යාපෘති

2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

අ/අ	වැය විෂය විස්තරය සහ වැය විෂය අංකය	2024 වර්ෂයට අදාළව අයවැය ඇස්තමේන්තු මඟින් ලද ප්‍රතිපාදනය (රු.මි)	පරිපූරක ඇස්තමේන්තු / මූ.ප්‍ර. 66 යටතේ මාරු කිරීම් (රු.මි)	ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	ප්‍රතිශතය (%)
01.	ගොවීන්ට ඉඩම් අයිතිය ලබාදීම 001-02-06-021-2509	1,075	-	1,075	567.18	52.76
02.	පළාත් සභා මඟින් වෘත්තීය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම 001-02-06-024-2509	450	(450)	-	-	-
03.	ශ්‍රී ලංකා ජාතික සන්නාමකරණය 001-02-06-025-2509	100	(100)	-	-	-
04.	අනුරාධපුර මහා විහාර විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම. 001-02-06-026-2509	400	(400)	-	-	-
05.	අනුරාධපුරයේ ජාත්‍යන්තර බෞද්ධ පුස්තකාලයක් පිහිටුවීම 001-02-06-027-2509	100	(100)	-	-	-
06.	මහනුවර බෞද්ධ ශිෂ්ඨාචාර කෞතුකාගාරය පිහිටුවීම. 001-02-06-028-2509	200	(200)	-	-	-
07.	ආර්ථික කොමිෂන් සභාව පිහිටුවීම 001-02-06-030-2509	250	-	250	-	-
08.	ජාතික ඵලදායිතා කොමිෂන් සභාව පිහිටුවීම 001-02-06-031-2509	150	-	150	-	-
09.	පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය 001-02-06-032-2509	8,000	(7,500)	500	-	-
10.	ජාතික ජනසභා ලේකම් කාර්යාලය 001-01-04-040-2509	700	-	700	0.233	0.03
11.	සත්‍ය හා ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයේ අන්තර්වාර ලේකම් කාර්යාලය 001-01-04-041-2509	2	-	2	0.191	9.55

2.2 වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම්

2.2.1 ජනතා සහභාගීත්වය (Inclusive Participation)

උතුරු නැගෙනහිර ජනතාව කාලයක් තිස්සේ මුහුණ දෙන ගැටලු සඳහා විසඳුම් ලබාදීම අත්‍යාවශ්‍ය කාරණයක් ලෙස සලකා, ඔවුන්ගේ නොවිසඳුණුවැඩපිළිවෙළ සමාජීය , ආර්ථික හා ඉඩම් ප්‍රශ්න විසඳීම සඳහා කඩිනමින් පියවර ගැනීමට පිහිටුවන ලද කාර්යයන් රාශියක් සම්බන්ධීකරණය කරන ලදී.

- **ඉඩම් ගැටලු :-** දිස්ත්‍රික් මට්ටමින්, මෙම කටයුතු අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහ අදාළ රේඛීය ආයතනයන්ගේ සහභාගීත්වයෙන් 2024 ජනවාරි මස වන විට, අධි ආරක්ෂක කලාපයකට අයත් අක්කර 3223.13ක ප්‍රමාණයක පෞද්ගලික ඉඩම් නිදහස් කර ඇත. 2024 ජනවාරි සිට 2024 ජුනි දක්වා අක්කර 330.51ක ප්‍රමාණයක ඉඩම් නිදහස් කිරීමට කටයුතු කර ඇත. අක්කර 243.83ක ඉඩම් ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතුවලට තාවකාලිකව භාවිතයට දී ඇත.
- වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි සීමා නිර්ණය කරන ලද ඉඩම් පිළිබඳව සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර , ගැසට් කරන ලද සම්පූර්ණ වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර් 554.3ක් වේ.
- **සංවර්ධන සැලසුම් සකස් කිරීම :-** උතුරු නැගෙනහිර ප්‍රදේශ සඳහා නව ජාතික සංවර්ධන සැලැස්මක් සකස් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- **පුනර්ජනනීය බලශක්ති විභවයන් සඳහා ආයෝජන ආරම්භ කිරීම :-** පෙට්‍රෝලියම් සංවර්ධන අධිකාරිය සහ ග්‍රීන්ස්ටැට් ඉන්දියා අතර හරිත හයිඩ්‍රජන් ව්‍යාපෘති සඳහා ගිවිසුමක් අත්සන් කර ඇත.
- **උතුරට ජලය ව්‍යාපෘතිය :-** පූනකේරි වැවට අදාළව 50,000 m^3/d ජල පිරිපහදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර අනුමත කරන ලදී.
- **නැවත පදිංචි කිරීම** :- අවතැන්වූවන් නැවත පදිංචි කිරීම යටතේ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණ කාර්යයන් සිදු කරන ලදි. මෙහි දී යාපනය, කිලිනොච්චි, අම්පාර දිස්ත්‍රික්කයන්හි ඉඩම් නිරවුල් කිරීම, නිවාස ව්‍යාපෘති, මාර්ග සංවර්ධනය, විදුලි සම්බන්ධතා ලබාදීම ඇතුළු වැඩමුළු ක්‍රියාත්මක කරන ලදී. මෙහි දී කිලිනොච්චි පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා වර්ග මීටර් 401,622ක ඉඩම්, පවුල් 11ක් සඳහා ලබා දී ඇත. පවුල් 204ක් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැවත පදිංචි කළ යුතුව ඇත.

එමෙන්ම, අධිකරණ, බන්ධනාගාර හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ඇති වන්දි ගෙවීමේ කාර්යාලය (Office for Reparations - OR) සමඟ සම්බන්ධීකරණ කාර්යයන් සිදු කිරීම සහ විශේෂ ක්‍රමවේදයක් හරහා එම ආයතනවල කාර්යභාරය අධීක්ෂණය කිරීම, අතුරුදහන්වූවන් පිළිබඳ සහතික නිකුත් කිරීම, චින්දිතයින් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව ලබා දීම සහ දේපළ හානි සඳහා වන්දි ගෙවීම වැනි කාර්යයන් සම්බන්ධීකරණය කරන ලදී. මෙහි දී අතුරුදහන් වූ පුද්ගලයින් 750ක් සඳහා රු. මිලියන 3,750ක වන්දි අනුමත කර ඇති අතර, මෙම වැඩපිළිවෙළ යටතේ උතුරු නැගෙනහිර ජනතාවගේ ආර්ථික, සමාජීය හා ඉඩම් ගැටලු විසඳීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත.

ජනාධිපති කාර්යාලයේ ආහාර සුරක්ෂිතතා අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද **"ආහාර සුරක්ෂිතතාවය සඳහා වන සංශෝධිත ප්‍රතිපත්ති රාමුව"** පාර්ලිමේන්තු අනුකාරක සභාවට ඉදිරිපත් කර, අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එම වාර්තාව 2024.06.04 දින කමිටු සභාපති විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අතර, මෙහි සඳහන් ක්‍රමෝපායයන් සහ ප්‍රතිපත්තීන් ඉදිරි

වර්ෂයේ සිට අදාළ අමාත්‍යාංශ හා ආයතනවල ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර, ක්‍රියාත්මක කරන ලෙස එම අමාත්‍යාංශ වෙත දන්වා ඇත.

2.2.2 ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සහ මෙහෙයුම්

අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම මැයෙන් ඉදිරිපත් කරන ලද අංක 24/0625/601/038-1 හා 2024.04.01 සහ 24/1064/601/038-ii හා 2024.06.03 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මඟින් ලද තීරණ පරිදි, මුදල් අමාත්‍යාංශයේ අංක DFD/2024-i සහ 2024.04.04 දිනැති චක්‍රලේඛය මඟින් අවශ්‍ය මාර්ගෝපදේශ අනුව, අඩු ආදායම්ලාභී පවුල්වල පෝෂණය පවත්වාගෙන යාම සඳහා එක් පවුලකට සහල් කි.ග්‍රෑ. 20 බැගින් පළමු වටයේ පවුල් මිලියන 2.74කට අප්‍රේල් සහ මැයි මාසවල සහල් ලබාදීම සහ දෙවන වටය මඟින් ජූලි සහ අගෝස්තු මාසවල පවුල් මිලියන 3.3කට සහල් ලබාදීම සිදු කරන ලදී.

තව ද, ජනාධිපති ලේකම් කාර්යාලයේ ස්ථාපිත ක්ෂණික දුරකථන අංකය සහ ලිඛිත ඉල්ලීම් මඟින් ආහාර සුරක්ෂිතතා ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා මහජනතාවට සහාය වීම යටතේ දුරකථනයෙන් සහ ලිපි මඟින් විමසීම් කළ පුද්ගලයින් සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කරන ලද අතර, අඩු ආදායම්ලාභී පවුල් විසින් අස්වැසුම සහ අනෙකුත් ආධාර ලබාගැනීමට කරන ලද ඉල්ලීම් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය සමඟ සම්බන්ධීකරණ කටයුතු කොට, ඔවුන් එම ආධාර වැඩසටහන් සඳහා ඇතුළත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම ද සිදු කර ඇත.

2.2.2.1. කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය පොහොර සහ අනෙකුත් යෙදවුම් සැපයීම තහවුරු කිරීම

2023/24 මහ කන්නය සඳහා පොහොර සුලභතාවය පවත්වා ගැනීම, නිසි වේලාවට ගොවීන්ට පොහොර සැපයීම සඳහා රාජ්‍ය අංශයේ නිලධාරීන් සහ පෞද්ගලික අංශයේ පොහොර ආනයනකරුවන් සමඟ සාකච්ඡා කර, කෘෂි යෙදවුම් අඛණ්ඩව වෙළෙඳපොළට සැපයීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකරන ලදී.

2.2.2.2. කෘෂි ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය

කෘෂි ක්ෂේත්‍රයේ සහ ඒ ආශ්‍රිත අංශවල ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික දැනුම සම්ප්‍රේෂණය සහ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හා බැංකු සම්බන්ධීකරණය හා මහපෙන්වීම සිදුකරන ලදී. මේ යටතේ අධි තාක්ෂණික මිරිස් වගා ක්ෂේත්‍ර ඇති කිරීම සහ අනෙකුත් කෘෂි භෝග වගාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හා ජනාධිපති කාර්යාලය ඒකාබද්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් නඟා සිටුවීම සඳහා රාජ්‍ය බැංකු සහ පුද්ගලික බැංකු මඟින් ලබාදෙන මූල්‍ය පහසුකම් පිළිබඳව සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ කර ගනිමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. තව ද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා රජය මඟින් හඳුන්වා දී ඇති සහනදායී ණය යෝජනා ක්‍රමය පිළිබඳව හරිත කෘෂිකර්ම හා කෘෂි නවීකරණ මෙහෙයුම් මධ්‍යස්ථානය හරහා ව්‍යවසායකයින් (Entrepreneurs) දැනුවත් කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය ද සිදු කරන ලදී.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා භාණ්ඩ අපනයනයට අවශ්‍ය නව ශාක නිරෝධායන ඒකක යාපනය, මහනුවර හා ගාල්ල පිහිටි ප්‍රධාන තැපැල් කාර්යාලයන්හි ස්ථාපිත කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ද සිදු කරන ලදී.

2.2.2.3. කෘෂිකර්ම නවීකරණය සහ ඉඩම් ප්‍රතිපත්ති

අංක 24/0428/601/031 හා 2024.03.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, කෘෂිකර්ම නවීකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී .මෙහි දී පළමු හා දෙවන අදියර යටතේ , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 26කට රු. මිලියන 650ක සහ රු. මිලියන 750ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

උරුමය වැඩසටහන මඟින් ඉඩම් සංවර්ධන ආඥා පනත ප්‍රකාරව කොන්දේසි සහිත බලපත්‍ර/ දීමනා පත්‍ර හිමි ගොවි පන්තියේ ජනතාව වෙත සින්නක්කර ඔප්පු 60,000ක් ලබා දී ඇති අතර ,මේ සඳහා 2024 අයවැය මඟින් රු. මිලියන 1,075ක් වෙන් කරන ලදී. මෙම ප්‍රතිපාදනවලින්, 2024 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 567.18ක් වැය වී ඇත. මීට අමතරව, පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති හා සංවර්ධන ප්‍රමුඛතා සම්බන්ධීකරණ කරන ලදී.

- උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය :- 2024 අප්‍රේල් 24 දින ඉරාන ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනතා අයිතියට පත්කරන ලදී.
- කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව :- කරන්දෙණිය ප්‍රදේශයේ පිහිටුවා 2024 ජූලි 10 දින විවෘත කරන ලදී.
- ජාතික ඉඩම් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා නීතිපතිතුමාගේ නිශ්කාෂණය ලබා ගෙන ඇත.
- 2024.03.04 දිනැති අමප/24/0370/601/026 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, "ඉඩම් කළමනාකරණ භාරය", ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් නිදහස් කිරීමේ කටයුතු සඳහා පිහිටුවා ඇත.
- අලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා ප්‍රවේශයක් ලෙස ජනාධිපති කමිටු රැස්වීම් 9ක් පවත්වන ලද අතර, විදුලි වැට ඉදිකිරීම් / නඩත්තුව පිළිබඳ පුහුණුවන්නන් සඳහා වැඩසටහන් 5ක් සංවිධානය කර ඇත.
- ජාතික වනෝද්‍යාන වෙත පිවිසීම සඳහා අන්තර්ජාලය ඔස්සේ දෛනික සංචාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලද අතර, ජාතික වනෝද්‍යාන වෙත පිවිසීම සඳහා පරිගණකගත ක්‍රමවේදයක් මඟින් අන්තර්ජාලය ඔස්සේ දෛනික සංචාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සිදු වේ.

2.2.3 කඳුකර දශකය 2024 - 2033

මධ්‍යම, සබරගමුව සහ ඌවත්ත කඳුකර ප්‍රදේශවල ජනතාවගේ සමාජ - ආර්ථික යටිතල පහසුකම් හා ජීවනෝපාය වර්ධනය තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින්, තෝරාගත් ක්ෂේත්‍ර 10ක් ඔස්සේ කඳුකර දශකය වැඩසටහන ක්‍රියාත්මක කළ අතර, අංක PS/FID/ID/Circular/01/2024 සහ 2024.01.24 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අදාළ උපදෙස් නිකුත් කරන ලදී. මේ යටතේ දිස්ත්‍රික්ක 11ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 97ක් ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලැබුණු ව්‍යාපෘති යෝජනා 14,417ක් අනුමත කර, ඊට අදාළ අනුමත ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

ඒ අනුව 2024.09.30 වනවිට "කඳුකර දශකය 2024-2033" විශේෂ වැඩසටහනට අදාළව රු.මි. 9,961ක ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 97ක් වෙත ලබාදී ඇත. මෙම අනුමත සියලුම ව්‍යාපෘති 2024.12.31 දිනට අවසන් කර ඇත.

භෞතික ප්‍රගතිය			මූල්‍ය ප්‍රගතිය		
අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව	අවලංගු කළ / ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති සංඛ්‍යාව	වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව	අනුමත කළ ප්‍රතිපාදනය (රු. මී.)	ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්හි ප්‍රතිපාදන වටිනාකම (රු.මී.)	වියදම (රු.මී.)
14,417	808	13,609	9,868.78	9,066.90	8,588.10

2.2.4 ලෝක ආහාර වැඩසටහන (WFP) - 2024

ශ්‍රී ලංකාව තුළ ලෝක ආහාර වැඩසටහන 1968 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන අතර, තිරසර සංවර්ධන ඉලක්ක (SDG) අංක 01 හා අංක 17 සපුරා ගැනීම සඳහා අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව තුළ වර්ෂ 05ක කාලයක් තුළ උපාය මාර්ගික සැලැස්ම 2023-2027 (CSP-2023-2027) ක්‍රියාත්මක කිරීම මඟින් තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂා කරමින්, පහත දැක්වෙන උපාය මාර්ගික ප්‍රවේශයක් ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

- ශ්‍රී ලංකාවේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් හඳුනාගෙන, අර්බුද අවස්ථාවන්හි දී පෝෂණ හා අනෙකුත් අවශ්‍යතා සපුරාලීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කුඩා දරුවන්ගේ පළමු දින 800 කෙරෙහි අවධානය යොමු කරමින් ඉලක්කගත කණ්ඩායම් සඳහා පෝෂණ අවශ්‍යතා ඉටු කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් තෝරා, කාලගුණික හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම.
- ආහාර සුරක්ෂිතතාවය, ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම් අරමුණින් ජාතික, ප්‍රාදේශීය රජයේ ආයතන හා එහි නිලධාරීන්ගේ හැකියා වර්ධනය, අවදානම් ප්‍රජාවන්ගේ හැකියා වර්ධනයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- හදිසි අවස්ථාවන්හි දී අත්‍යාවශ්‍ය ආහාර බෙදාදීම
- සහල් සවිබලකරණ ව්‍යාපෘතිය (Rice Fortification)
- ගෙවතු පාදක කරගත් පාසල් ආහාර වැඩසටහන
- සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම :- (Food For Asset Program - යාපනය දිස්ත්‍රික්කය)
- සහල් ගබඩා නවීකරණය.
- සත්‍යක්ෂණය වැඩසටහන (Sathyekshanaya)
- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- South Triangular Cooperation Program
- වෙනත් ව්‍යාපෘති

2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

මූල්‍ය ක්ෂේත්‍රය	ප්‍රතිපාදන වෙන් කිරීම (රු. මි.)	වියදම (රු. මි.)	ප්‍රතිශතය %
13 (WFP අරමුදල්)	2,381.97	2,139.82	89.83
17 (GOSL අරමුදල්)	325.00	232.34	71.50

2.3 වෙළෙඳ ගිවිසුම් සහ තරඟකාරී ආර්ථිකයක් ඇති කිරීම

2.3.1. වෙළෙඳ ගිවිසුම්වලට එළඹීම

දේශීය ආර්ථිකය පුනර්ජීවනය කිරීමේ පියවරක් ලෙස අපනයනය ඉලක්ක කරගත් සෘජු විදේශ ආයෝජන වැඩි දියුණු කිරීම සඳහා කලාපීය සහ ගෝලීය සැපයුම් දාමයන් වෙත ප්‍රවේශ වීම සඳහා, ගෝලීය ආර්ථිකය සමඟ නැවත සම්බන්ධ වීම ඉලක්ක කරගනිමින් පුළුල් නිදහස් වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමට පැවති රජය විසින් සැලසුම් කරන ලදී. මෙහි දී ජාතික වෙළෙඳ සාකච්ඡා කමිටුවක් මඟින් විශාල සෘජු විදේශ ආයෝජන ඇති ඉන්දියාව, චීනය සහ තායිලන්තය යන වෙළෙඳපොළ සඳහා උපායමාර්ගික වැදගත්කමක් ඇති නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා නැවත පණ ගන්වන ලද අතර, ජාත්‍යන්තර වෙළෙඳ කාර්යාලය ද ස්ථාපිත කරන ලදී.

ජාත්‍යන්තර වෙළෙඳ කාර්යාලය මඟින් පහත පරිදි වෙළෙඳ සාකච්ඡා පවත්වා ඇත.

අ/අ	වෙළෙඳ සාකච්ඡා/ ගිවිසුම්	විස්තරය
1.	ඉන්දියා - ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම (ETCA)	– 13 වන සාකච්ඡා වාරය - 2024.01.08 දින සිට 10 දින දක්වා ඉන්දියාවේ දී සහ 14 වන සාකච්ඡා වාරය - 2024.07.24 දින සිට 26 දින දක්වා කොළඹ දී පවත්වන ලදී.
2.	ඉන්දුනීසියාව සමඟ එළඹීමට නියමිත යෝජිත වරණීය වෙළෙඳ ගිවිසුම (ISLPTA) පිළිබඳ පළමු වෙළෙඳ සාකච්ඡා කමිටු රැස්වීම	– 2024.04.03 දින සිට 04 දින දක්වා අතත්‍ය මාධ්‍ය ඔස්සේ සහ දෙවන සාකච්ඡා වාරය - 2024.07.15 දින සිට 16 දින දක්වා කොළඹ දී පවත්වන ලදී.
3.	ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම	– 2024 පෙබරවාරි 03 වන දින තායිලන්ත අග්‍රාමාත්‍යවරයාගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ දී අත්සන් තබන ලදී. – සිංහල හා දෙමළ බසට පරිවර්තනය කරන ලද ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම 2024.07.12 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. – ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම (SLTFTA) අපරානුමත කිරීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2024.08.12 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.
4.	බංගලාදේශය සමඟ වරණීය නිදහස් වෙළෙඳ ගිවිසුම	– ශ්‍රී ලංකාවේ ඉල්ලුම් ලැයිස්තුව සකස් කිරීම සඳහා අදහස් හුවමාරු කර ගැනීමට 2024.02.20 සහ 2024.03.20 යන දිනයන්හි දී දේශීය පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.

එමෙන්ම, භාණ්ඩ වෙළෙඳාම, සේවා වෙළෙඳාම, ප්‍රභවස්ථාන රීති, සනීපාරක්ෂාව හා ශාක සනීපාරක්ෂාව, වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක (TBT), රේගු ක්‍රියා පටිපාටි සහ වෙළෙඳ පහසුකම්, වෙළෙඳ ප්‍රතිකර්ම, නීති කටයුතු, ආර්ථික සහයෝගීතාව ආදී කරුණු සම්බන්ධව ඉන්දියාව, බංගලාදේශය සහ ඉන්දුනීසියාව යන රටවල් සමඟ සාකච්ඡා වාර පැවැත්වීම සම්බන්ධීකරණය සඳහා පහසුකම් සැලසීමට කටයුතු කරන ලදී.

එමෙන්ම, ආර්ථික පරිවර්තන පනත (Economic Transformation Bill) කෙටුම්පත් කිරීම සඳහා අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලද අතර, එම පනත 2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනත නමින් 2024.08.09 දිනැතිව බලාත්මක කර ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇත.

2.3.2 හිතකර ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම

ආයෝජකයින්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සාර්ව ආර්ථික මට්ටමේ මුලපිරීම් සහ ක්‍රියාමාර්ග සිදු කරන අතරතුර, ව්‍යාපාර සක්‍රීය පරිසරයක් (Business Enabling Environment) නිර්මාණය කිරීම වෙනුවෙන් ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලද අතර, ව්‍යාපාරයක් ආරම්භ කිරීම, ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සහ ව්‍යාපාරයක් පුළුල් කිරීම යන සෑම අදියරකදීම අදාළ වන අනිවාර්ය සේවා සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය ආයතන කාර්ය සාධක බලකා කමිටු අටකට ගොනු කර ප්‍රමුඛතා පදනමින් ආයතනික පද්ධති සංවර්ධන / ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා අදාළ ක්‍රියාකාරී සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

2.4 නව රජය යටතේ ජනාධිපති කාර්යාලයේ එතෙක් පැවති සංවිධාන ගත හා අවශ්‍ය බෙදීමේ ව්‍යුහය සංශෝධනයට ලක්ව ඇත.

01. සංවර්ධන පරිපාලන අංශය

❖ **උපායමාර්ගික කටයුතු අංශය**

අන්තර් අමාත්‍යාංශ සහයෝගීතාවය සඳහා පහසුකම් සැලසීම, ප්‍රධාන මුලපිරීම් නිරීක්ෂණය කිරීම සහ ආයතනික ප්‍රතිසංස්කරණ ඇතුළත්, කාර්යක්ෂම සහ තිරසාර රාජ්‍ය සේවා ප්‍රතිඵල ලබා දීමට හැකිවීම මඟින් ජාතික සංවර්ධන ප්‍රමුඛතා ඵලදායී හා මනා සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.

❖ **ආහාර සුරක්ෂිතතා සහ ප්‍රතිපත්ති අංශය**

නව රජය ජාතික ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව (Security) ඇති කිරීම සහ ආහාර ආරක්ෂිතව (Food Safety) ලබා දීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කර ඇති අතර, සෑම පුරවැසියෙකුගේම අවම ආහාර අවශ්‍යතාව ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව දැරිය හැකි මිලකට ලබා දීම එහි ප්‍රධාන අරමුණකි. මේ සඳහා ක්‍රියාමාර්ග රැසක් ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් ඉදිරිපත් කර ඇති අතර, රටේ නිෂ්පාදනය කළ හැකි සියලුම ආහාර දේශීයව නිෂ්පාදනය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම, අවම වශයෙන් මාස තුනකට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම, රටේ පවතින ආහාර තොග පිළිබඳව දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම සහ ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඉවහල්වන නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදාහැරීම, තොග හා සිල්ලර වෙළෙඳාම යන ක්‍රියාවලීන් සඳහා පෞද්ගලික අංශයේ ද සහභාගීත්වය ලබා ගනිමින් වඩා සඵලදායී වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා රජය ප්‍රමුඛ අවධානයක් යොමුකර ඇත.

ඒ අනුව, මෙම කාර්යය ඉටුකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/2089/801/003 හා 2024.12.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කැබිනට් අමාත්‍යවරුන් දෙදෙනෙකු සම සභාපතිත්වයෙන් හා සමාජිකයින් 12 දෙදෙනෙකුගෙන් සමන්විතව ආහාර ප්‍රතිපත්ති සහ සුරක්ෂිතතා කමිටුව ස්ථාපිත කරන ලදී.

- **සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය**

2024 වර්ෂයේ සිදුකළ විමධ්‍යගත අයවැය වැඩසටහන ඇතුළුව සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මෙහෙයුම් කිරීම හා අවසන් වාර්තා සකස් කිරීම සිදු කර ඇත.

02. මූල්‍ය හා ආර්ථික කටයුතු අංශය

"පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි ඇතුළත් ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය විස්තීර්ණ මූල්‍ය මෙහෙයුම් හා ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දීම, ආංශික සංවර්ධන උපායමාර්ග නිශ්චය කිරීම, ආර්ථික අංශයේ ප්‍රතිසංස්කරණ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ මූල්‍ය පහසුකම් වැඩසටහන සම්බන්ධීකරණය, දේශීය හා විදේශීය ආයෝජන දිරි ගැන්වීම, වෙළෙඳපොළමෙහෙයුම්, නිදහස් වෙළෙඳ ගිවිසුම් හා පර්යේෂණ සහ සංවර්ධන වාණිජකරණ ජාතික ප්‍රවේශය සම්බන්ධව අදාළ රේඛීය හා ආංශික ආයතන සම්බන්ධීකරණය සහ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැපයීමේ කේන්ද්‍රීය ඒකකය ලෙස මෙම අංශය ක්‍රියාකරනු ලබයි.

03. පරිපාලන හා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා අංශය

පරිපාලන හා රාජ්‍ය තාන්ත්‍රික කටයුතු අංශය ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර තුනක් කෙරෙහි අවධානය යොමු කරයි රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව රාජ්‍ය අංශයේ පාලනය, ඩිජිටල් පාලනය සහ රාජ්‍ය තාන්ත්‍රික පාලනය.

❖ රාජ්‍ය අංශයේ පාලනය

රාජ්‍ය අංශයේ පාලනය සඳහා, කාර්යක්ෂම සේවා සැපයීම සහතික කිරීම සඳහා රාජ්‍ය අංශයේ පරිවර්තන ඒකකයක් (PSTU) ස්ථාපිත කිරීම, පරිවර්තන නීති සම්පාදනය කිරීම, ඉලක්ක මත පදනම් වූ කාර්ය සාධන ඇගයීම් ක්‍රියාත්මක කිරීම සහ කුසලතා මත පදනම් වූ වෘත්තීයභාවය සහතික කිරීම මෙම අංශයේ අරමුණු අතර වේ.

❖ ඩිජිටල් පාලනය

ඩිජිටල් පාලනයේදී, ප්‍රධාන ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍ර හඳුනා ගැනීම, අවශ්‍යතා තක්සේරු කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ගැටලුවිසඳීම සඳහා පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කිරීම හරහා පුරවැසි කේන්ද්‍රීය ඩිජිටල්කරණය කරන ලද සේවාවන්ට මෙම අංශය ප්‍රමුඛත්වය දෙයි. ජනාධිපති අරමුදල් සේවා විමධ්‍යගත කිරීම, e-BMD වැඩසටහන ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අංශයේ ඩිජිටල් සන්නිවේදනය වැඩිදියුණු කිරීම, රාජ්‍ය අංශයේ ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ නිල විද්‍යුත් තැපැල් භාවිත ප්‍රතිපත්ති හඳුන්වා දීම මෙම අංශයේ විශේෂිත මුලපිරීම් අතර වේ.

❖ රාජ්‍ය තාන්ත්‍රික පාලනය

රාජ්‍ය තාන්ත්‍රික පාලන සංරචකය, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම මගින් ජාතික සංවර්ධනය සඳහා උපායමාර්ගික රාජ්‍ය තාන්ත්‍රිකභාවය වැඩි දියුණු කිරීම කෙරෙහි

අවධානය යොමු කරයි. ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට වාර්ෂික රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා සැලැස්මක් සංවර්ධනය කිරීම, ශ්‍රී ලාංකික ඩයස්පෝරාව සඳහා ගෝලීය සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයින් සඳහා මාර්ගගත විදේශ ගමන් බලපත්‍ර සැකසුම් පද්ධතියක් නිර්මාණය කිරීම සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඩයස්පෝරා දායකත්වය යොමු කිරීම සඳහා දානපති දායකත්ව කළමනාකරණ වේදිකාවක් දියත් කිරීම ඇතුළත් වේ. රාජ්‍ය තාන්ත්‍රික සම්පත් හරහා ශ්‍රී ලංකාවේ ගෝලීය ප්‍රතිරූපය ගොඩනැගීම සහ විධිමත් ප්‍රොටෝකෝල හරහා ජනාධිපති රාජ්‍ය තාන්ත්‍රිකභාවය ශක්තිමත් කිරීම ද මෙහි අරමුණයි. රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම, ජාත්‍යන්තර පාර්ශවකරුවන්ගේ සම්බන්ධතා සඳහා පහසුකම් සැලසීම, ජනාධිපති රාජ්‍ය සංචාර සම්බන්ධීකරණය කිරීම, ජනාධිපති ප්‍රොටෝකෝල අත්පොතක් සංවර්ධනය කිරීම, රාජ්‍ය තාන්ත්‍රික සන්නිවේදන වාර්තා පවත්වාගෙන යාම, ජනාධිපති රාජ්‍ය තාන්ත්‍රික ද්වාරයක් දියත් කිරීම සහ ගෝලීය භූ දේශපාලනික සිදුවීම් පිළිබඳ නිතිපතා වාර්තා සකස් කිරීම මෙයට ඇතුළත් වේ.

04. දූෂණ විරෝධී හා විශේෂ විමර්ශන අංශ

ජනාධිපති කාර්යාලය, සියලුම අමාත්‍යාංග හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි වංචාව, දූෂණය, නාස්තිය හා විවිධ පරිපාලනමය අක්‍රමිකතා සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි වලට අදාළ විමර්ශන සිදු කිරීම හා එමඟින් අනාවරණය වන කරුණු පිළිබඳ අදාළ කටයුතු සඳහා නෛතික බලධාරීත්වය හිමි ආයතන වලට යොමු කිරීම දූෂණ විරෝධී හා විශේෂ විමර්ශන අංශයේ මූලික කාර්යභාරය වන අතර, ඊට අමතරව රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් යොමුවන ඇතැම් මහජන පැමිණිලි හා චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය සිදු කිරීම සඳහා එම ආයතනය මඟින්ම කටයුතු කර එහි ප්‍රගතිය සොයා බැලීම මෙන්ම රජයේ විගණන හා අභ්‍යන්තර විගණන අංශවල විගණන වාර්තා සහ ඊට අදාළ නිරීක්ෂණ පිළිබඳව අවධානය යොමුකර අවශ්‍ය උපදෙස් ලබා දීම, දැනුවත් කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී නීත්‍යානුකූල පියවර හා විනයානුකූල පියවර ගැනීම සඳහා වන සුදුසු නිර්දේශයන් අදාළ ආයතනයන්හි බලධාරීන්ට යොමුකිරීමද අපේක්ෂිතය.

2.5 2025 ඉදිරි දැක්ම

පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්

2024.09.21 වන දින පැවති ජනාධිපතිවරණයේ දී සහ 2024.11.14 දින පැවති මහ මැතිවරණයේදී ශ්‍රී ලංකාවේ දේශපාලන පරිවර්තනයක් සිදු කරමින් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව ශ්‍රී ලංකාව දියුණු හා පොහොසත් රටක් බවට පත්කිරීම සඳහා ජනතාවගේ අනුමැතිය සහිත නව රජයක් බලයට පත් වූ අතර, ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික යන සියලු අංශයන්හි වර්ධනයක් තුළින් ශ්‍රී ලංකාව පොහොසත් සහ දියුණු ජාතියක් බවට පත් කිරීම ඉලක්ක කරගත් නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

එහි මූලික අභිමතාර්ථ ලෙස -:

- ජාතික සමගිය ගොඩ නැගීම සහ ජාතික, ආගමික, සංස්කෘතික සහජීවනය ගොඩනැංවීම.
- ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී භිමිකම් සහ බහු පක්ෂ ක්‍රමය ශක්තිමත් කරමින්, සියලු දේශපාලන ව්‍යාපාර සහ විවිධ ජන කණ්ඩායම්හි ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කිරීම මඟින් ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් රාජ්‍යයක් බිහි කිරීම.
- පාර්ලිමේන්තුවේ ගෞරවය නැවත ඇති කිරීම.
- ජනතාවගේ මූල්‍ය බලය සහ ජනතාව වෙනුවෙන් නීතිය සම්පාදනය කිරීමේ ප්‍රධාන අයිතිය ඇති පාර්ලිමේන්තුව මහජන කේන්ද්‍රීය පාර්ලිමේන්තුවක් බවට පත්කිරීම.
- ශක්තිමත්, ගුණාත්මක සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම සඳහා රජයේ යෝජනා සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහ සෑම අතින්ම තෘප්තිමත් වූ රාජ්‍ය සේවයක් ඇතිකිරීම.
- යුක්තිය හා සාධාරණත්වය යළි රට තුළ ස්ථාපිත කිරීම සඳහා නීතියේ විධානයේ ආධිපත්‍ය සහ නීතිය පිළිබඳ ජනතාවගේ තිබෙන විශ්වාසය යළිත් තහවුරු කිරීම මඟින් නීතියේ විධානයේ ආධිපත්‍ය තහවුරු කිරීම සහ විනිදිතයන්ට සාධාරණය ඉටුකිරීම.
- ආර්ථිකය ස්ථාවර කිරීම.

ආර්ථිකය මුහුණ දී ඇති ගැඹුරුතම අර්බුදයන් තිරසාර ලෙස ජයගැනීම සඳහා හඳුන්වාදෙන උපායමාර්ග පහත පරිදි වේ.

- භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ වේගවත් වර්ධනයක් හා ප්‍රසාරණයක් ඇති කර ගැනීම.
- ක්‍රියාකාරී ජනතා සහභාගීත්වයක් සහිත ආර්ථිකයක් ඇති කිරීම.
- ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව වෙත සාධාරණව ජනතාවට බෙදාහැරීම.

තව ද, ආර්ථිකයේ සියලු අංශ ආවරණය කරමින් ආර්ථික ජයග්‍රහණ ලබාගැනීම සඳහා නව්‍ය ප්‍රවේශයක් ඔස්සේ ක්‍රියාමාර්ග රැසක් ගැනීමට නියමිතය.

- සංචාරක හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි කඩිනම් සංවර්ධනය :- ඉදිරියේ දී මිලියන හතරක සංචාරකයන් කැඳවා ගැනීම තුළින් සමස්ත ඩොලර් බිලියන අටක ආර්ථිකයක් උත්පාදනය කර ගැනීමත් නිපුණතාවය සහ සාක්ෂරතාවය සහිත ව්‍යක්තීයවේදීන් ඉහළ නංවාගැනීම තුළින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නව පරිවර්තනයක් ඇතිකරමින් ඩොලර් බිලියන පහක අපනයන ආදායම් ඉලක්කය සපුරාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
- කාර්යක්ෂමතාවය සහ ප්‍රශස්ත කළමනාකරණයක් තුළින් නාවික ක්ෂේත්‍රයේ සැලසුම් සහගත සංවර්ධනයක් ඇතිකර ගැනීම මඟින් ශ්‍රී ලංකාව එහි භූගෝලීය පිහිටීමේ වාසිය ද ලබා ගනිමින් නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම.

- කෘෂිකාර්මික අංශයේ නවීකරණය :- පවතින විභවයන් උපයෝගී කර ගනිමින් සහ කෘෂිකාර්මික පර්යේෂණයන්හි, ව්‍යාප්ති සේවාවන්හි සක්‍රීය දායකත්වය ලබාගනිමින් දේශීය මෙන්ම අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් කෘෂි නිෂ්පාදනයන්ට අවතීර්ණ වීම.
- ධීවර කර්මාන්තයේ සංවර්ධනය :- ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රයට ඇති ඉහළ විභවයන් සැලසුම්ගත ලෙස සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා භාවිතා කිරීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය :- රටේ තිබෙන ස්වභාවික සම්පත් විශේෂයෙන්ම ඛනිජ සම්පත් මත ආර්ථිකයේ විශාල විභවයක් නිර්මාණය වී තිබෙන බැවින්, ඒවා මත පදනම්ව අගය එකතු කිරීමේ නිෂ්පාදන දිරිගැන්වීමත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඒ සඳහා අවස්ථාවන් ඉහළ නංවාගැනීම.
- ලෝකයේ නව්‍ය වෙළෙඳපොළ අත්පත් කරගැනීම සඳහා නවෝත්පාදනය ඔස්සේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පරිවර්තනයක් ඇතිකර ගැනීම.
- ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා පංගුව අත්පත් කරගැනීම උදෙසා නව්‍යකරණය වූ තානාපති සේවයක් යොදාගැනීම.

රටේ සමස්ත සංවර්ධනය අරමුණු කරගනිමින් ප්‍රධාන උපායමාර්ග තුනක් ඔස්සේ රට ඉදිරියට මෙහෙයවීම ගරු ජනාධිපතිතුමාගේ අරමුණයි.

- ක්ලීන් ශ්‍රී ලංකා (Clean Sri Lanka)
- දිළිඳුබව තුරන් කිරීම (Poverty Alleviation)
- ඩිජිටල් ආර්ථිකයක් (Digital Economy)

- **ක්ලීන් ශ්‍රී ලංකා**

යහපත් ආකල්ප, යහපත් ක්‍රියාකාරකම්, යහපත් හැසිරීම් සහ එමඟින් යහපත් පුරවැසියන් ජාතියක් නිර්මාණය කරගැනීමේ අරමුණින් ආකල්පමය පරිවර්තනයක් සිදු කිරීම සඳහා පොදු ජනතාවගේ සක්‍රීය දායකත්වය සහිත ජාතික මට්ටමේ ව්‍යාපාරයක් දියත් කිරීම.

- **දිළිඳුබව තුරන් කිරීම**

ගුණාත්මක අධ්‍යාපනය, ආහාර සුරක්ෂිතතාවය, නිවාස සහ ප්‍රමාණවත් ආදායම් මාර්ග ඇතිකිරීම මඟින් සෑම පුරවැසියකුගේම ජීවන තත්ත්වය උසස් කිරීමත්, ග්‍රාමීය වශයෙන් සහ නාගරික වශයෙන් වූ දුප්පත්භාවය තුරන් කිරීමත් රජයේ ප්‍රධාන මෙහෙයුමක් බවට පත්වනු ඇත. එමෙන්ම ළඳරු සහ ළමා මන්දපෝෂණය තුරන් කිරීම, මාතෘ සෞඛ්‍ය සහ පෝෂණය ඉහළ නැංවීම, ආබාධිත ප්‍රජාව ඇතුළුව ආර්ථික සහ සමාජීය වශයෙන් ආන්තික ජනකණ්ඩායම් සවිබලගැන්වීම තුළින් සියලු පුරවැසියන්ගේ සුබසාධනය රජයේ වගකීමක් ලෙස සහතික කෙරෙනු ඇත.

- **ඩිජිටල් ආර්ථිකයක්**

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ඩිජිටල් යටිතල පහසුකම් යන අංශවලින් ගෝලීය ප්‍රමිතින්ට ළඟා වීම රජයේ අපේක්ෂාව වන අතර, පුරවැසියන් සවිබල ගැන්වීම උදෙසා ඩිජිටල් පොදු යටිතල පහසුකම් (Digital Public Infrastructure) ස්ථාපිත කිරීම මඟින් බහු-ආංශික ඩිජිටල් පරිවර්තනයක් සඳහා රජය දැඩිව කැප වී සිටියි. ඒ අනුව, වේගවත් ඩිජිටල් ආර්ථිකයකට සහ සියලු පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට තුඩු දෙන ආර්ථික හා සමාජ සංවර්ධනයට අදාළ

සාම්ප්‍රදායික සංවර්ධන අවස්ථා ග්‍රහණය කර ගැනීමට හැකිවන පරිදි නවීන තාක්ෂණය භාවිත කරමින් ඩොලර් බිලියන පහළොවක ඩිජිටල් ආර්ථිකයක් ඇතිකර ගැනීම රජයේ ඉලක්කයයි. ඉහත ක්‍රියාමාර්ග, ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව 2025 වර්ෂයේ සිට නව ශ්‍රී ලංකාවක් බිහිකිරීම සඳහා මඟපෙන්වනු ඇත.

ආචාර්ය එන්.එස්.කුමානායක
ජනාධිපති ලේකම්

03 පරිච්ඡේදය

2024.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒඝිඒ-එල්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	තත්‍ය 2,024	2,023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඝිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		3,918,119,000	3,531,014,417	ඒඝිඒ-3
-	නැන්පතු		278,356,776	19,653,920	ඒඝිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		61,129,349	65,864,353	ඒඝිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**4,257,605,125**	**3,616,532,690**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**4,257,605,125**	3,616,532,690	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**61,700,678**	132,500	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)**		**4,195,904,447**	**3,616,400,190**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
1,067,787,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,031,708,617	914,206,523	
2,606,834,075.07	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	2,077,925,383	2,268,677,304	ඒඝිඒ-2(ii)
378,043,506.67	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	364,559,525	88,634,710	
-	පොළී ගෙවීම්	8	-	-	
220,800.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	208,300	10,500	
4,052,885,381.74	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**3,474,401,825**	**3,271,529,037**	
	මූලධන වියදම්				
521,550,118.26	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	404,821,215	404,186,792	
121,000,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	83,651,760	138,374,673	
2,725,000,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	2,372,165,159	3,615,517,651	ඒඝිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
2,500,000.00	හැකියා වර්ධනය	14	2,205,185	2,579,249	
31,177,000,000.00	වෙනත් මූලධන වියදම්	15	19,599,608,687	370,897,472	
34,547,050,118.26	**මුළු මූලධන වියදම් (උ)**		**22,462,452,007**	**4,531,555,837**	
	නැන්පතු ගෙවීම්		272,091,153	22,490,259	ඒඝිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		42,138,969	83,890,882	ඒඝිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**314,230,123**	**106,381,141**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**26,251,083,955**	**7,909,466,015**	
38,599,935,500.00	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(22,055,179,507)**	**(4,293,065,825)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**(22,055,179,507)**	**4,293,065,825**	ඒඝිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒඝිඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය	
		2024	**2023**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	44,122,282,318	42,352,274,582
කල්බදු ආයෝජන			19,808,524
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	96,234,887	115,062,031
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**44,218,517,206**	**42,487,145,137**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		80,866,235	105,959,001
දේපළ පිරියත හා උපකරණ සංචිතය		44,122,282,318	42,352,274,582
කල්බදු වගකීම්	**ඒසිඒ-5(බී)**		19,808,524
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	15,368,653	9,103,030
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**44,218,517,206**	**42,487,145,137**

පිටු අංක 11 සිට 75 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 76 සිට 99 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ගණකාධිකාරී
නම :- එන්.එම්. ආනන්ද අමරදේව
තනතුර :- ප්‍රධාන මූල්‍ය නිලධාරී
දිනය :- 2025.02.24

එන්.එම්. ආනන්ද අමරදේව
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ජනාධිපති කාර්යාලය
කොළඹ 01

ගණන්දීමේ නිලධාරි
නම :- ආචාර්ය එන්.එස්. කුමානායක
තනතුර :- ජනාධිපති ලේකම්
දිනය :- 2025.02.

ආචාර්ය එන්. එස්. කුමානායක
ජනාධිපති ලේකම්
ජනාධිපති කාර්යාලය
කොළඹ 01

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :- ආචාර්ය එන්.එස්. කුමානායක
තනතුර :- ජනාධිපති ලේකම්
දිනය :- 2025.02.

ආචාර්ය එන්. එස්. කුමානායක
ජනාධිපති ලේකම්
ජනාධිපති කාර්යාලය
කොළඹ 01

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2024 රු.	**2023** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	47,328,491	47,290,887
අග්‍රිම ලැබීම්	3,918,119,000	3,531,014,417
අත්තිකාරම් අයකර ගැනීම්	58,297,904	91,784,771
තැන්පතු ලැබීම්	278,356,776	19,653,695
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**4,302,102,171**	**3,689,743,770**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,989,499,204	2,776,257,316
සහනාධාර සහ මාරුකිරීම්	364,559,525	88,571,810
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	5,476,462	36,411,270
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	61,700,678	132,500
අත්තිකාරම් ගෙවීම්	44,679,103	85,615,210
තැන්පතු ගෙවීම්	272,091,153	22,490,034
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**3,738,006,126**	**3,009,478,140**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**564,096,045**	**680,265,630**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	564,096,045	680,265,630
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**564,096,045**	**680,265,630**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(564,096,045)**	**(680,265,630)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවලදී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය: අදාළ නොවේ.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	3,779,000,000.00	4,052,885,381.74	3,474,401,824.90	86%
මූලධන	31,428,000,000.00	34,547,050,118.26	22,462,452,006.97	65%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

#	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් ප්‍රතිපාදනවල % ගණන ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ණය ශේෂ නිරවුල් කිරීම	3,017,761.96	3,017,761.96	3,017,761.96	100%
2	මුදල් අමාත්‍යාංශය	ගරු ජනාධිපතිතුමා හා දූත පිරිස සහභාගී වූ ස්විස්ටර්ලන්ත සංචාරය (2024.01.13 - 2024.01.17) සඳහා මුදල් අමාත්‍යාංශයෙන් සහභාගී වූ දේශාල් ඩි මෙල් මහතාගේ ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සඳහා Worldlink Travels (Pvt) Ltd වෙත ගෙවීම් කිරීම.	1,671,200.00	1,671,200.00	1,671,200.00	100%
3	මුදල් අමාත්‍යාංශය	ගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2023.10.31 දින ජාත්‍යන්තර සංවිධානවල සහ රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් ටාජ් සමුද්‍රා හෝටලයෙහි	787,500.00	787,500.00	787,500.00	100%

		පැවති දෙවන High Level Round Table වැඩසටහන වෙනුවෙන් දරන ලද වියදම් ගෙවීම් නිරවුල් කිරීම.				

3.8 මූල්‍ය - නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම් කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	3,164,383,129.80	3,164,383,129.80	-	100%
9152	යන්ත්‍රෝපකරණ	4,961,935,617.62	4,961,935,617.62	-	100%
9153	ඉඩම්	35,646,525,000.00	35,646,525,000.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	11,596,171.02	11,596,171.02	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	337,842,400.00	337,842,400.00	-	100%

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

සටහන : 2024 වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාව ඇමුණුම 1 ලෙස අමුණා ඇත.

04 පරිච්ඡේදය

ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

#	ක්‍රියාකාරකම් / අයිතම	කාර්යසාධන දර්ශකය	සත්‍ය නිමැවුම (%) (අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස)		
			100 - 90	89-75	74 - 50
ජනාධිපති කාර්යමණ්ඩල ප්‍රධානී අංශය					
1	ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම සහ මඟපෙන්වීම	සිදු කළ මැදිහත්වීම් සංඛ්‍යාව	√		
2	ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්/ ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් හා කාර්යමණ්ඩල ප්‍රධානීතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීම් හා සාකච්ඡා ඵලදායී ලෙස පැවැත්වීම තහවුරු කිරීම, සම්බන්ධීකරණය හා එහිදී ගනු ලබන තීරණ පසුවිපරම් කිරීම	පවත්වනු ලබන රැස්වීම් සංඛ්‍යාව සකස් කරන ලද රැස්වීම් සටහන් සංඛ්‍යාව පසුවිපරම් කළ තීරණ සංඛ්‍යාව	√		
3	ජනාධිපති කාර්යාලය වෙත ලැබෙන විශේෂ අවධානය යොමු කළ යුතු ලිපි, විද්‍යුත් තැපැල් පණිවුඩ, දුරකථන ඇමතුම්, ෆැක්ස් පණිවුඩ හා වට්ස්ඇප් (WhatsApp) මඟින් ලැබෙන විවිධාකාර ඉල්ලීම් පිළිබඳව නිසි පියවර ගැනීම හා පසුවිපරම	පසුවිපරම් කළ ලිපි / ඉල්ලීම් සංඛ්‍යාව	√		
ජනාධිපති ලේකම් කාර්යාංශය					
1	නොවිසඳී ඇති මහජන හා ආයතනික ගැටලු ඉදිරිපත් කිරීමට ජනාධිපති ලේකම් හමුවීමට පැමිණෙන ආයතන හා පුද්ගලයින් සම්බන්ධීකරණය කිරීම	ආයතන සමඟ සම්බන්ධීකරණය කරන ලද පුද්ගල සංඛ්‍යාව හා ආයතන සංඛ්‍යාව	√		
2	ජනාධිපති ලේකම් වෙත අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා විවිධ ආයතන මඟින් ලැබෙන ලිපි සහ වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ අංශ වෙත යොමු කිරීම	නියමිත පරිදි අදාළ අංශ/ නිලධාරීන් වෙත යොමු කරන ලද වාර්තා, ලිපි සහ ලිපි ගොනු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග	√		
3	බාහිර පාර්ශව වෙතින් දේශීය හා විදේශීය වශයෙන් ලැබෙන පරිත්‍යාග අදාළ ආයතන/ අංශ/ මහජනතාව වෙත ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය	සම්බන්ධීකරණය කරන ලද ආයතන හා පුද්ගල සංඛ්‍යාව	√		

#	ක්‍රියාකාරකම් / අයිතම	කාර්යසාධන දර්ශකය	සත්‍ය නිමැවුම (%) (අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස)		
			100 - 90	89-75	74 - 50
4	ජනාධිපති ලේකම්තුමා වෙත යොමු කරනු ලබන මහජන ගැටලු/පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම	ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන ගැටලු/ පැමිණිලි සංඛ්‍යාව	√		
5	ජනාධිපති ලේකම්තුමා මුලසුන දරන රැස්වීම් සංවිධානය, සම්බන්ධීකරණය කිරීම, අදාළ රැස්වීම්වලදී ගනු ලබන තීරණවල ප්‍රගතිය විමසීම	සම්බන්ධීකරණය කරන ලද / සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව	√		
6	දිස්ත්‍රික්කවල පවතින නොවිසඳුණු ගැටලු සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම්තුමාගේ සහභාගිත්වයෙන් පවත්වන ලබන රැස්වීම් අවශ්‍ය අවස්ථාවන්හිදී සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම	විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව	√		
7	5 හා ඉහත 6 හි පවත්වනු ලබන රැස්වීම් වලදී ගනු ලබන තීරණ පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	පවත්වනු ලබන රැස්වීම් සංඛ්‍යාව	√		
8	අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන්ගේ විවිධ ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම	අදාළ සම්බන්ධීකරණයන් සාර්ථකව සිදු කිරීම	√		
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශය					
1	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව සිදු කරනු ලබන පත්කිරීම්.	අවස්ථානුකූලව පත් කිරීම	√		
2	ජනාධිපති විධානයන් මගින් සිදු කරනු ලබන පත්කිරීම්	අවස්ථානුකූලව පත් කිරීම	√		
3	විවිධ අණපනත්වලට අනුකූලව සිදු කරනු ලබන පත්කිරීම්	අවස්ථානුකූලව පත් කිරීම	√		
4	වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් ක්‍රියාත්මක කළයුතු කාර්යයන් ඉටුකිරීම	අවස්ථානුකූලව පත් කිරීම	√		
5	රජයේ ඉඩම් සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමන් සතු බලතල ක්‍රියාත්මක කිරීම	ගරු ජනාධිපතිතුමාගේ අනුමැතියෙන් රජයේ ඉඩම් ලබාදීම	√		
පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු					
1	**පාර්ලිමේන්තු කටයුතු**				
1.1	පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය වන සියලුම රැස්වීම් සම්බන්ධීකරණය	අවශ්‍ය පරිදි කඩිනමින් සිදුකිරීම	√		

#	ක්‍රියාකාරකම් / අයිතම	කාර්යසාධන දර්ශකය	සත්‍ය නිමැවුම (%) (අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස)		
			100 - 90	89-75	74 - 50
1.2	ජනාධිපති කාර්යාලයේ විෂය පථයට අදාළ වාචික හා වාචික නොවන පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කර අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත යොමු කිරීම	නියමිත දිනට සතියකට පෙර අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත යොමු කිරීම	√		
2	**අමාත්‍ය මණ්ඩල කටයුතු**				
2.1	අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමුකළ යුතු අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ සහිත සාරාංශ සටහන් සකස්කර ගරු ජනාධිපතිතුමා සහ ජනාධිපති ලේකම් වෙත යොමු කිරීම	කඩිනමින් ඉටුකිරීම	√		
2.2	ජනාධිපති ලේකම් විසින් ක්‍රියාකළ යුතු අමාත්‍ය මණ්ඩල තීරණ අදාළ අංශ වෙත යොමු කිරීම හා පසුවිපරම් කටයුතු	අවශ්‍ය පරිදි කඩිනමින් සිදුකිරීම	√		
2.3	ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා වලට අදාළ සියලුම රාජකාරී	වහාම කටයුතු කිරීම	√		
2.4	අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සාරාංශ සටහන් හා තීරණ ක්‍රියාත්මකවීමේ පසුවිපරම් කටයුතු සඳහා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම	දෛනිකව යාවත්කාලීන කිරීම	√		
2.5	අමාත්‍ය මණ්ඩල රැස්වීම් හා අමාත්‍ය මණ්ඩල අනුකමිටු රැස්වීම් වලට අදාළ කටයුතු සම්බන්ධීකරණය	ඉතා කඩිනමින් සිදුකිරීම	√		
3	**සංස්ථාපිත කටයුතු**				
3.1	සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා ආයතන ප්‍රධානීන් හා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් පත් කිරීමට අදාළ සියලුම කටයුතු i. අදාළ අමාත්‍යාංශ වෙතින් ලැබෙන ඉල්ලීම් ii. ලිපි සඳහා යෝජිත පුද්ගලයින්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම (High-Post Committee) iii. අදාළ කමිටුව මඟින් අනුමැතිය ලබා ගැනීම iv. පත්වීම් ලිපි නිකුත් කිරීම	අවශ්‍ය පරිදි කඩිනමින් සිදුකිරීම	√		

#	ක්‍රියාකාරකම් / අයිතම	කාර්යසාධන දර්ශකය	සත්‍ය නිමැවුම (%) (අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස)		
			100 - 90	89-75	74 - 50
3.2	සංස්ථා,මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා ආයතන ප්‍රධානීන් සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් පත් කිරීම්වලට අදාළ අභියාචනා හා චෝදනා සම්බන්ධ ඉදිරි කටයුතු	ඉල්ලීම් ලැබී සතියක් තුළ ක්‍රියා කිරීම	√		
3.3	සංස්ථා, මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා ආයතන ප්‍රධානීන් සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් පත් කිරීම්වලට අදාළ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ පසුවිපරම	දෛනිකව යාවත්කාලීන කිරීම	√		
4	**විශේෂ කටයුතු**				
4.1	දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිවරුන් / සම සභාපතිවරුන් පත් කිරීම	අවශ්‍ය පරිදි කඩිනමින් සිදුකිරීම	√		
4.2	ගරු ජනාධිපතිතුමා සහ ජනාධිපති ලේකම් වෙත යොමු කරන ලද පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල විෂයට අදාළ විවිධ ඉල්ලීම් සම්බන්ධ රාජකාරී කටයුතු	අවශ්‍ය පරිදි කඩිනමින් සිදුකිරීම	√		
මානව සම්පත් කළමනාකරණ, පාලන හා ප්‍රවාහන අංශය					
1	ජනාධිපති කාර්යාලය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.	ස්ථාන මාරුවී නොපැමිණි කාර්ය මණ්ඩල ප්‍රමාණය	√		
2	ජනාධිපති කාර්යාලය සඳහා අවශ්‍යතාවය මත බඳවාගත් නිලධාරීන් හා සේවකයින් හැකියාව අනුව ස්ථානගත කිරීම	අතිරික්ත නිලධාරින් සංඛ්‍යාව හෝ පුරප්පාඩු සහිත අංශ ප්‍රමාණය	√		
3	කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය පවත්වා ගැනීම.	කාර්ය සාධන මට්ටම අවම නිලධාරින් සම්බන්ධයෙන් වූ පැමිණිලි නොමැතිවීම	√		
4	කාර්ය මණ්ඩල සඳහා උසස්වීම් හා බඳවාගැනීමේ පරිපාටි සකස් කර අවසන් කිරීම් හා ඊට අදාළව කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා යොමු කිරීම.	ඉදිරිපත් වූ ඉල්ලීම් ප්‍රමාණය ඉටු කළ ප්‍රමාණය		√	
5	පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කොට විධිමත් කිරීම.	පරීක්ෂා කළ ලිපි ගොනු ප්‍රමාණය හා විධිමත් කළ ලිපිගොනු ප්‍රමාණය	√		
6	සේවකයින් නියමිත කාල වලදී විශ්‍රාම ගැන්වීම හා විශ්‍රාම වැටුප් සකස් කිරීමට අදාළ කටයුතු.	ඉදිරිපත් වූ ඉල්ලීම් ප්‍රමාණය හා කටයුතු කළ ප්‍රමාණය	√		
7	ජනාධිපති කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරීන් සඳහා රජයේ අත්තිකාරම් "බී" ගිණුම මඟින් ණය මුදල් අනුමත කිරීම.	ඉදිරිපත් වූ ඉල්ලීම් ප්‍රමාණය	√		

#	ක්‍රියාකාරකම් / අයිතම	කාර්යසාධන දර්ශකය	සත්‍ය නිමැවුම (%) (අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස)		
			100 - 90	89-75	74 - 50
8	අනුග්‍රාහ වාර ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කිරීම,දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අදාළ බිල්පත් පිවීම.	ඉල්ලීම් ප්‍රමාණය හා නිකුත් කළ ප්‍රමාණය	√		
9	ජනාධිපතිතුමාගේ හා ජනාධිපති කාර්යාලයේ නිල සංචාරයන් සඳහා සහභාගීවන දූත මණ්ඩල සඳහා දීමනා ගෙවීම.	නිල සංචාර ප්‍රමාණය හා දීමනා ගෙවූ ප්‍රමාණය	√		
10	කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය දේශීය/ප්‍රාරම්භ/සේවාස්ථ/සේවා මූලික පුහුණු හා වෙනත් පුහුණු ලබා දීම හා විදේශ ශිෂ්‍යත්ව/පුහුණු හා උපාධි වැඩසටහන්	ලද පුහුණු වැඩසටහන් ප්‍රමාණය හා පුහුණු වැඩසටහන් සඳහා යොමු කල නිලධාරීන් සංඛ්‍යාව	√		
11	රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම ජනාධිපති කාර්යාලයේ නිලධාරීන් සඳහා පහසුකම් සලසා දීම.	ඉදිරිපත් වූ ඉල්ලීම් ප්‍රමාණය හා පහසුකම් සැලසූ ප්‍රමාණය	√		
ආර්ථික කටයුතු අංශය					
1	පහත අමාත්‍යාංශ හා ඒ යටතේ වන රාජ්‍ය අමාත්‍යාංශ හා ආයතන විසින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න පසුවිපරම් කිරීම • මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය • ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය • විදේශ කටයුතු අමාත්‍යාංශය • විදේශ රැකියා අමාත්‍යාංශය • සෞඛ්‍ය අමාත්‍යාංශය • සංචාරක අමාත්‍යාංශය • කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම්	අමාත්‍යාංශ ක්‍රියාකාරකම්වලට අදාළව ක්‍රියාත්මක වූ තීරණ සංඛ්‍යාව පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව ගන්නා ලද තීරණ සංඛ්‍යාව ක්‍රියාත්මක කර අවසන් කරන ලද තීරණ සංඛ්‍යාව		√	
2	පහත දැක්වෙන අමාත්‍යාංශ විෂය පථයන්ට අදාළව ජනාධිපති කාර්යාලය වෙතට යොමු කෙරෙන ගැටලු/ඉල්ලීම්/යෝජනා/ පැමිණිලි පිළිබඳ විමසා සුදුසු කටයුතු ඉටු කිරීම සඳහා යොමු කිරීම • මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය • ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය • විදේශ කටයුතු අමාත්‍යාංශය • විදේශ රැකියා අමාත්‍යාංශය • සෞඛ්‍ය අමාත්‍යාංශය • සංචාරක අමාත්‍යාංශය • කාන්තා, ළමා කටයුතු හා සමාජ	යොමු කරන ලද ගැටලු/ ඉල්ලීම්/යෝජනා/ පැමිණිලි සංඛ්‍යාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලද ගැටලු/ ඉල්ලීම්/ යෝජනා සංඛ්‍යාව		√	

#	ක්‍රියාකාරකම් / අයිතම	කාර්යසාධන දර්ශකය	සත්‍ය නිමැවුම (%) (අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස)		
			100 - 90	89-75	74 - 50
	සවිබලගැන්වීම් අමාත්‍යාංශය				
6.2	School of Governance පිහිටුවීමta(2023 ජනවාරි මස 09 වන දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත කළ පරිදි, 2048 වර්ෂය වන විට ශ්‍රී ලංකාව ලෝකයේ සංවර්ධිත රටක් බවට පරිවර්තනය කිරීමේ වැඩපිළිවෙළ යටතේ නව ආයතන ස්ථාපිත කිරීමට ලබා දී ඇති අනුමැතිය අනුව එහි අංක iv හි දක්වා ඇති පරිදි රජය හා රාජ්‍ය ප්‍රතිපත්ති විශ්ව විද්‍යාලයට පිහිටුවීමට අදාළ රාජකාරී සම්බන්ධීකරණය හා අධීක්ෂණය සිදු කිරීම) අදාළ සම්බන්ධීකරණය ඉටු කිරීම	පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව	√		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය

ති.සං අරමුණු අංක	අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය %		
				0-49	50-74	75-100
1.	**සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම**	**<u>ජනාධිපති අරමුදල</u>** මහජන ඉල්ලීම් සඳහා නිසි ක්‍රමවේදයක් යටතේ ප්‍රදාන ලබාදීම	ලබා දුන් මුදල් ප්‍රමාණ			√
		<u>උතුරු පළාත් සම්බන්ධීකරණ අංශය</u> රජය භාරයේ ඇති ඉඩම් එම ඉඩම් වල නිත්‍යානුකූල හිමිකරුවන් වෙත ලබාදීම	ලබා දුන් ඉඩම් ප්‍රමාණ		√	
		<u>ජීවනෝපාය අරමුණු කරගත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u> i. කඳුකර දශකය ii. විමධ්‍යගත අරමුදල වැඩසටහන iii. ලෝක ආහාර වැඩසටහන	දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව			√
2.	**කුසගින්න තුරන් කිරීම** සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.	ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති සංඛ්‍යාව		√	

4.	**ගුණාත්මක අධ්‍යාපනයක්** පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම් අවස්ථා සැලසීම.	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම	ප්‍රතිපත්තිමය තීරණ			√
		සැමට සමාන හා ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කිරීමට පහසුකම් සැලසීම	ජනාධිපති අරමුදල යටතේ ලබා දෙන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව			√
6.	**පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව** සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසාර කළමනාකරණය සහතික කිරීම.	සැමට පානීය ජලය ලබාදීම සම්බන්ධයෙන් ව්‍යාපෘති ආරම්භ කිරීම	සිදුකරන ලද සම්බන්ධීකරණයන්		√	
8.	**සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය** ප්‍රශස්ත ආර්ථික වර්ධන වේගයක් පවත්වාගැනීම සහ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම	වෙළෙඳ ගිවිසුම් සහ තරඟකාරී ආර්ථිකයක් ඇති කිරීම 1. දේශීය ආර්ථිකය පුනර්ජීවනය අරමුණු කරගත් යෝජනා ප්‍රවර්ධනය සඳහා අපනයන ඉලක්ක කරගත් වෙළෙඳ ගිවිසුම්වලට එළඹීම	ඇති කරගත් වෙළෙඳ ගිවිසුම්		√	
		2. හිතකර ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම.	හිතකර ආයතනික පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා සිදුකළ ආයතනික ප්‍රතිසංස්කරණ		√	
9.	**කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්** සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ	නව කර්මාන්ත සඳහා ආයෝජන ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම	සහභාගි වන ලද රැස්වීම් සංඛ්‍යාව ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ සංඛ්‍යාව		√	

	තිරසාර කාර්මිකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.					
13.	**දේශගුණික ක්‍රියාකාරකම්** දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම.	දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රතිපත්තිමය ප්‍රවේශයන් ඇති කිරීම .	ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ සංඛ්‍යාව		√	
16.	**සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන** තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය උදෙසා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.	ජාතික සමඟි සහ ප්‍රතිසන්ධානය සඳහා යෝජිත වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි (OMP) විමර්ශනය සිදු කිරීම සහ හානිපූරණය	ගන්නා ලද ක්‍රියාමාර්ග සංඛ්‍යාව සිදු කරන ලද ගෙවීම් සංඛ්‍යාව		√	

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

2024.12.31 දිනට සේවයේ යෙදී සිටින ජනාධිපති කාර්යාලයේ පත්වීම්ලාභීන්

මට්ටම	ස්ථිර / දීප ව්‍යාප්ත / ඒකාබද්ධ	අනුයුක්ත	කොන්ත්‍රාත්	තාවකාලික	එකතුව
ජ්‍යෙෂ්ඨ	76	18	0	24	118
තෘතීයික	21	6	3	5	35
ද්විතීයික	322	17	1	28	368
ප්‍රාථමික	187	23	2	16	228
එකතුව	**606**	**64**	**06**	**73**	**749**

6.2 කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

පත්වන ජනාධිපතිවරයාගේ දැක්ම හා මෙහෙවර අනුව කාර්යය හා කර්තව්‍යයන් වෙනස් වන බැවින් ජනාධිපති කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු හෝ අතිරික්ත, ඇති නොවන ආකාරයට කටයුතු කරනු ලැබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

ජනාධිපති කාර්යාලයේ කාර්යයන්හි කාර්යක්ෂමතාවය හා ක්‍රමානුකූල බව පවත්වා ගැනීම සඳහා ඵලදායිතාවය, ප්‍රසම්පාදනය, තොරතුරු තාක්ෂණය හා භාෂා ප්‍රවීණතාවය යන ක්ෂේත්‍රයන්හි ලබා ගත් දැනුම හා අන්තර්ජාතික ලෙස ආර්ථික, බලශක්ති, ඉදිකිරීම්, සංචාරක ක්ෂේත්‍රයන්හි නව්‍ය සංකල්ප මෙහෙයුම් සම්බන්ධ දැනුම දායක කරගනිමින් ජනාධිපති කාර්යාලයීය ආවේණික විෂය පථයන් ඔස්සේ කාර්ය සාධනය ඉහළ නැංවීම.

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	ඉලක්ක කරන ලද නිලධාරීන්	පාඨමාලා කාලය	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම /ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
1	ලේඛන සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ දෙදින	1	තෘතීයික	2024.02.06 & 07	රු.7,500	-	දේශීය	අදාළ ක්ෂේත්‍රයන්හි වෘත්තීමය දැනුම, හැකියාවන්

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	ඉලක්ක කරන ලද නිලධාරින්	පාඨමාලා කාලය	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම /ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
	පුහුණු වැඩමුළුව							හා කුසලතා
2	Policy Workshop on Universal Acceptance and Email Address Internationalization	1	තෘතීයික හා ද්විතීයික	29.02.2024	රාජ්‍ය නිලධාරින් සඳහා ගාස්තු අය නොකෙරේ.	-	දේශීය	
3	Diploma in Diplomacy & World Affairs	2	විධායක	One Year	රු.340,000	-	දේශීය	
4	Speech craft Training with Toastmasters International	6	විධායක	Nov-24	රු.210,000	-	දේශීය	
5	දෙමළ භාෂා පාඨමාලාව - පැය 100	53	ප්‍රාථමික	2022.12.17 - 2023.04.01	රු. 75,000/=	-	දේශීය	
6	Realizing the Right to Adequate Housing in the Context of Habitat III New Urban Agenda – Policies, Planning & Practice - ITEC	1	විධායක	05.02.2024 – 23.02.2024	-	ERD මඟින් ලබා දුන් පුහුණු වැඩසටහන් වේ	විදේශීය	අදාළ ක්ෂේත්‍රයන්හි අන්තර්ජාතික වෘත්තීමය දැනුම, හැකියාවන් හා කුසලතා
7	Master in Trade and Industrial Policy for Innovative Growth and Resillience - KOICA	1	විධායක		-		විදේශීය	
8	Seminar on Whole Processing Engineering Consulting Management of EPC Projects in the Construction Sector for Developing Countries	1	විධායක	20.03.2024 - 02.04.2024	-		විදේශීය	
9	Seminar on Digital Economy and Industry Integration under the Global Development Initiative	1	විධායක	29.03.2024 - 11.04.2024	-		විදේශීය	
10	Seminar on Enhancing Performance of	2	විධායක	29.03.2024 - 11.04.2024	-		විදේශීය	

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	ඉලක්ක කරන ලද නිලධාරීන්	පාඨමාලා කාලය	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම /ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
	Young Officials in Developing Countries							
11	Seminar on Global Value Chains for Developing Countries	1	විධායක	29.03.2024 - 11.04.2024	-		විදේශීය	
12	Seminar on Green Economy and Environmental Protectin for Developing Countries	1	විධායක	29.03.2024 - 11.04.2024	-		විදේශීය	
13	Seminar on Government Effectiveness and Efficiency for Developing Countries	1	විධායක	09.04.2024 - 22.04.2024	-		විදේශීය	
14	Seminar on Capacity Building for Think Tanks from BRI Countries	1	විධායක	09.04.2024 - 22.04.2024	-		විදේශීය	
15	Seminar on Governance Capacity and Social Development for B&R Countries	1	විධායක	10.04.2024 - 23.04.2024	-		විදේශීය	
16	Seminar for Young Diplomats from Sri Lanka	1	විධායක	16.04.2024 - 29.04.2024	-		විදේශීය	
17	Seminar on Jointly Building a High Quality Digital Silk Road and Building a New Pattern of Global Digital Cooperation for Belt and Road Countries	1	විධායක	19.04.2024 - 25.04.2024	-		විදේශීය	
18	Food Labelling Workshop	1	විධායක	21.04.2024 - 25.04.2024	-		විදේශීය	
19	First Mid-Career Training Programme	2	විධායක	13.05.2024 - 24.05.2024	-		විදේශීය	
20	ITEC Executive Course on Global Trends in Building Infrastructure for	2	විධායක	28.04.2024 - 11.05.2024	-		විදේශීය	

ERD මඟින් ලබා දුන් පුහුණු වැඩසටහන් වේ

අදාළ ක්ෂේත්‍රයන්හි අන්තර්ජාතික වෘත්තීමය දැනුම, හැකියාවන් හා කුසලතා

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	ඉලක්ක කරන ලද නිලධාරීන්	පාඨමාලා කාලය	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම /ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
	Development							
21	Dongfang Scholarship Program/2024 - PKU	1	විධායක	06.05.2024 - 06.06.2024	-		විදේශීය	
22	Seminar on Ecotourism Development and Management for Sri Lanka	1	විධායක	10.07.2024 - 23.07.2024	-		විදේශීය	
23	Technologies of Agricultural Mechanization to Ensure Food Security Under the Global Development Initiative for Developing Countries	1	විධායක	23.08.2024 - 12.09.2024	-		විදේශීය	
24	Special Course for Sri Lankan diplomats and officers	2	විධායක	05.08.2024 - 13.08.2024	-		විදේශීය	
25	Seminar on E-commerce Standardization Cooperation between China and South Asian Countries	2	විධායක	29.08.2024 - 11.09.2024	-		විදේශීය	
26	55th Session of the Cairo International Book Fair – Cultural Event on Literature and Creativity	1	විධායක	31.01.2024 - 07.02.2024	-	ERD මඟින් ලබා දුන් පුහුණු වැඩසටහන් වේ	විදේශීය	අදාළ ක්ෂේත්‍රයන්හි අන්තර්ජාතික වෘත්තීමය දැනුම, හැකියාවන් හා කුසලතා
27	Interanational Visitor Leadership Programme	1	විධායක	02.03.2024 - 25.03.2024	-		විදේශීය	
28	New Issues in Security Course	1	විධායක	22.04.2024 - 14.06.2024	-		විදේශීය	
29	Government Analytics Fellowship Programme	2	විධායක	27.05.2024 - 07.06.2024	-		විදේශීය	
30	Saemaul Undong Invitational Training Course	2	විධායක	31.03.2024 - 08.04.2024	-		විදේශීය	

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	ඉලක්ක කරන ලද නිලධාරීන්	පාඨමාලා කාලය	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම /ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
31	Invitation to visit Huawei cloud experience center and workship on Government Digitalization and Payment Ecosystem for Sri Lankan Government Officials	1	විධායක	09.04.2024 - 11.04.2024	-		විදේශීය	
32	Follow up Tour for COP 28	2	විධායක	07.04.2024 - 10.04.2024	-		විදේශීය	
33	IMF - Micro Econometric Forecasting and Analysis Program	1	විධායක	04.11.2024 - 15.11.2024	-		විදේශීය	
34	2024 Korea Foundation Invitation Program for Distinguished Guests	1	විධායක	14.04.2024 - 20.04.2024	-		විදේශීය	
35	Canberra Fellowship Programme	1	විධායක	27.04.2024 - 05.05.2024	-		විදේශීය	
36	International Election Visitors' Programme	8	විධායක	04.05.2024 - 09.05.2024	-		විදේශීය	
37	Innovations in Governance	1	විධායක	26.05.2024 - 31.05.22024	-	ERD මඟින් ලබා දුන් පුහුණු වැඩසටහන් වේ	විදේශීය	අදාළ ක්ෂේත්‍රයන්හි අන්තර්ජාතික වෘත්තීමය දැනුම, හැකියාවන් හා කුසලතා
38	WHO South-East Asia Regional meeting on nutrition and climate change	1	විධායක	14.05.2024 - 16.05.2024	-		විදේශීය	
39	Industrial and Financial Strategies for a sustainable, just, economic transformation and development workshop	1	විධායක	15.05.2024	-		විදේශීය	
40	GSMA APAC Cyber Security Forum	1	විධායක	28.05.2024	-		විදේශීය	
41	Fintech Training Workshop	1	විධායක - 05 විධායක නොවන- 01	01.07.2024 - 05.07.2024	-		විදේශීය	

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	ඉලක්ක කරන ලද නිලධාරීන්	පාඨමාලා කාලය	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම /ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
42	WTO Advanced Course on Analyzing Trade in Services Nominated by Department of Trade	1	විධායක	04.06.2024 - 07.06.2024	-		විදේශීය	
43	International Visitor Leadership Programme	1	විධායක - 01	02.03.2024 - 25.03.2024	-		විදේශීය	
44	Training Programme for Sri Lankan Journalists and Media Professinals	2	විධායක	24.06.2024 - 06.07.2024	-		විදේශීය	
45	Nutrition Financing in Asia: Capacity strengthening workshop	2	විධායක	27.08.2024 - 30.08.2024	-		විදේශීය	
46	Green Hydrogen Study and networking tour	1	විධායක	09.09.2024 - 13.09.2024	-		විදේශීය	
47	Future of Subsea Cables - South Asia Workshop	2	විධායක	01.10.2024	-		විදේශීය	
48	Inception Workshop for the ADAPT4R Project Under the Country Strategic Plan 2023/7	1	විධායක	21.10.2024	-		විදේශීය	
49	Nourishing South Asia Regional Meeting on "Scaling Impact of Large-Scale Food Fortification for Prevention Macronutrient Deficiencies in Children and Women in South Asia"	1	විධායක	23.10.2024 - 25.10.2024	-		විදේශීය	

පහත සඳහන් කාර්යයන් මානව සම්පත් කළමනාකරණ අංශය විසින් කරනු ලබයි

01. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(1) අනුව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපති කාර්යාලයේ නිලධාරීන් පත්කිරීම සහ එම නිලධාරීන්ගේ සේවය අවසන් කිරීම, ස්ථානමාරු කිරීම, මුදාහැරීම හා විශ්‍රාම ගැන්වීම් කටයුතු.

02. ජනාධිපති කාර්යාලයේ සේවයේ නියුක්ත දීප ව්‍යාප්ත, ඒකාබද්ධ සේවාවන් හා සංවෘත සේවාවන්ට අදාළ නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කිරීමේ සිට උසස් කිරීම්ද, කාර්ය සාධන වාර්තා ඇගයීම හා වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම ද ඇතුළත්ව විශ්‍රාම ගන්වන තෙක් වූ සියලුම ආයතනික කටයුතු.

03. ඒකාබද්ධ සේවාවන්ට හෝ සෘජු පත්වීම්ලාභී නිලධාරීන්ට අදාළ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සහ සෘජු පත්වීම්ලාභී නිලධාරීන්ගේ තෘතීයක මට්ටමේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග හා / හෝ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

04. කොන්ත්‍රාත් හා තාවකාලික නිලධාරීන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ ලියාපදිංචි කිරීම හා සේවය අවසන් කරන ලද කොන්ත්‍රාත් හා තාවකාලික නිලධාරීන්ට රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

05. ජනාධිපති කාර්යාලයේ සියලුම නිලධාරීන් හට දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබාදෙමින් ඵලදායී සේවයකට යොමු කරවා ගැනීම.

06. සියලුම නිලධාරීන්ගේ අග්‍රහාර ඉල්ලීම් සම්බන්ධ කටයුතු.

07. මාසික අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කිරීම, දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අදාළ බිල්පත් පියවීමේ කටයුතු.

08. නිලධාරීන්ගේ දේපල ණය හා ආපදා ණය සම්බන්ධ ඉල්ලීම්වලට අදාළ කටයුතු.

09. නිශ්කාෂන වාර්තා සම්පූර්ණ කර ගැනීම.

10. සියලුම නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධයෙන් වාර්තා සැපයීම හා ඊට අදාළ කටයුතු.

11. නිලධාරීන්ගේ තොරතුරු දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා වාර්තා නිකුත් කිරීම.

07 පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකිශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන පුද්ගල / පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවෙනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුමවිගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම.	අනුකූල නොවේ	2024 වර්ෂයේ තෙවන හා හතරවන කාර්තුවලදී ජනාධිපති කාර්යාලයේ පරිපාලන හා කළමනාකරණ පද්ධතියේ ඇතිවූ ව්‍යුහාත්මක වෙනස්කම් නිසා.	2025 වර්ෂයේ කාර්තුවකට01 රැස්වීමක් බැගින් විගණන හා කළමනාකරණ රැස්වීම් 04ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තඋනතා හා , ලේඛයේ වෙනත් නිර්දේශ චක්‍ර සඳහන් කාලය තුල සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව , වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	තිබීම			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ යුතු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වල අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.2	මු.රෙ. 371 ප්‍රකාරවඅනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරවඅනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිමනිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවෙනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ජනාධිපති කාර්යාලයේ නම් කළ තොරතුරු නිලධාරි විසින් සිදු කරනු ලැබේ.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.04.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඇමුණුම 1
இணைப்பு 1
Annexure 1

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் தலைமை அதிபதியின் அறிக்கை
Report of the Auditor General

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/C/24/24/PO/FA

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 ජූනි 26 දින

26 JUN 2025

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ජනාධිපති ලේකම් කාර්යාලය

ශීර්ෂය 001 - අතිගරු ජනාධිපති ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 001 - අතිගරු ජනාධිපති ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජනාධිපති ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජනාධිපති ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.35,180,492,000 ක අග්‍රිම සැලසුම් කර අග්‍රිමය රු.34,968,065,000ක් ඉල්ලුම් කර තිබුණද සත්‍ය වශයෙන් ලද අග්‍රිමය රු.3,918,119,000ක් විය. ඒ අනුව ලද අග්‍රිමය සැලසුම් කළ හා ඉල්ලුම් කළ අග්‍රිමයෙන් සියයට 11 ක් වී තිබුණි. තවද, කාර්යාලය විසින් මාස හතරකදී සැලසුම් කළ අග්‍රිමයට වඩා වැඩියෙන් භාණ්ඩාගාරයෙන් අග්‍රිම ඉල්ලුම් කර තිබුණි.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 ඇස්තමේන්තු ප්‍රතිපාදන අවශ්‍යතාවට වඩා වැඩියෙන් සලසා ගැනීම

(අ) ක්‍රියාකාරී සැලසුමට අනුකූලවන පරිදි වියදම් ඇස්තමේන්තු සකස් කර ප්‍රමාණවත් හා වඩාත් නිවැරදිව ප්‍රතිපාදන වෙන් කරවා නොගැනීම හේතුවෙන් වැය විෂයයන්වලට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

(i) වැය විෂයන් පහක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයම වැය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

(ii) වැය විෂයය අංක 001-2-6-32-2509 (පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය)හි ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් පාර්ලිමේන්තු අතිරේක ප්‍රතිපාදන මඟින් රු.7,500,000,000ක් හෙවත් සියයට 94ක් වෙනත් වැය විෂයන් කිහිපයකට මාරු කිරීමෙන් පසුවත් ඉතිරි ශුද්ධ ප්‍රතිපාදනයවූ රු.500,000,000ක් කිසිදු වියදමක් නොකර සම්පූර්ණ මුදලම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයන් 11ක මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයකට ප්‍රතිපාදන මාරු කළ පසුද ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට 73 දක්වා පරාසයක ඉතිරි වී තිබුණි.

(ඇ) වැය විෂයන් 23ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 30 සිට 98 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඈ) වැය විෂයයන් 11ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට 89 අතර ප්‍රමාණයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කර තිබුණි.

(ඉ) වැය විෂයන් 05ක පාර්ලිමේන්තු අතිරේක ප්‍රතිපාදන මඟින් මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි.

3.2.2 අවශ්‍යතාවට වඩා ඌන ඇස්තමේන්තු සලසා ගැනීම

(අ) වැය විෂයන් 16ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයට අමතරව මු.රෙ.66 මඟින් ප්‍රතිපාදන සලසාගෙන සියයට 25 සිට 400 ක් දක්වා පරාසයක මුදල් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි.

(ආ) වැය විෂය අංක 001-2-6-3-2509 (සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය) සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.500,000,0000ක් වූ අතර පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.1,000,000,000ක් හා පාර්ලිමේන්තු අතිරේක ප්‍රතිපාදන මඟින් රු.8,750,000,000ක් වශයෙන් එකතුව රු.9,750,000,000ක අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. අතිරේකව සලසාගත් ප්‍රතිපාදන ප්‍රමාණය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 1,950ක් වී තිබුණි.

(ඇ) වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට අමතරව මු.රෙ.66, පරිපූරක ඇස්තමේන්තු හා පාර්ලිමේන්තු අතිරේක ප්‍රතිපාදන මඟින් අමතර ප්‍රතිපාදන සලසාගත් වැය විෂයයන් 03ක සියයට 44ත් 49ත් අතර වියදම් නොකර ඉතිරිකර තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) ජනාධිපති ලේකම්ගේ අංක PS/FM/FIN/16/13-2023 දරණ 2023 ජූනි මස 09 වන දිනැති ලිපිය හා 2024 මාර්තු 21 දිනැති PS/ADM/OS/134 දරණ ලිපිය ප්‍රකාරව	ලිපිවල විධිවිධාන හා උපදෙස් පරිදි කටයුතු නොකර දිගින් දිගටම අත්තිකාරම් පියවීම ප්‍රමාදවූ නිලධාරීන් පස්දෙනෙකු වෙත නැවත නැවතත් අග්‍රිම මුදල් ලබා දී තිබූ අවස්ථා 14ක් නිරීක්ෂණය විය.
(ආ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.5 ඡේදය ප්‍රකාරව	විශ්‍රාමික නිලධාරියෙකු ආපසු ගෙවා අවසන් කර නොමැති ණය මුදලකින් අයකර ගැනීමට ඉතිරිව තිබෙන මුදල් එම නිලධාරීන්ගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදල් වලින් අයකර ගත යුතු බවට දක්වා තිබුණද ජනාධිපති ලේකම් කාර්යාලයේ 2006 වර්ෂයේදී විශ්‍රාම ගිය නිලධාරියකගෙන් අයවිය යුතු රු.144,768ක් වූ ආපදා ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) 371(2)(ආ) ප්‍රකාරව	2024 වර්ෂය තුලදී අවස්ථා 85කදී ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිම දින 20 සිට දින 70 දක්වා කාලයක් අතර ප්‍රමාද වී පියවා තිබුණි. අත්තිකාරම් මුදල් ලබාගත් තැනැත්තාගේ තනතුර ලේඛණයේ සටහන් නොකිරීම හේතුවෙන් අත්තිකාරම් මාණ්ඩලික නිලධාරීන්ට පමණක් ලබා දුන් බවට විගණනයට තහවුරු කර ගත නොහැකි විය.
(ii) 880(i) ප්‍රකාරව	කාර්යාලයේ රජයේ නිලධාරීන් ස්වකීය රාජකාරී කටයුතු සඳහා තැබිය යුතු ආරක්ෂිත ඇප තබා නොතිබුණි.
(ඈ) කොමිප්ට්‍රෝලර් ජනරාල්ගේ 2018 දෙසැම්බර් 31 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ 1.3.1 ඡේදය සහ ජනාධිපති ලේකම්ගේ අංක PS/FIN/Circular/02/2023 හා 2023.07.19 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 4.1.3.1 ඡේදය ප්‍රකාරව	කාර්යාලය සතු වාහන 2017 වර්ෂයෙන් පසු වර්තමාන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) (i) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 1 කොටසෙහි 13.2 ඡේදයේ මු.රෙ.770(4)(ඉ) හි රාජ්‍ය ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීමට අදාල මාර්ගෝපදේශය ප්‍රකාරව	රාජ්‍ය ආයතන වල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීමට අදාල මාර්ගෝපදේශය අනුගමනය නොකර කාර්මික විද්‍යාලයකට වාහන දෙකක් හා විහාරස්ථානයකට වාහන 11ක් ලබාදී තිබුණි.
(ii) ඉහත චක්‍රලේඛයේ 8.8 ඡේදය ප්‍රකාරව	සාමාන්‍ය වෙළඳපොලේ නිශ්කාෂණය කිරීම යෝග්‍ය නොවන එනම් විශේෂ ආරක්ෂක, වෙඩි නොවදින වැනි සුවිශේෂ පහසුකම් සහිත වාහන ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ අපහරණය කළ යුතු වුවද කාර්යාලයේ අධි ආරක්ෂිත රථය සහ විහාරස්ථානයක් වෙත ලබාදී තිබූ වෙඩි නොවදින රථ සම්බන්ධයෙන් එසේ කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.
(ඊ) 1986 අංක 04 ජනාධිපතිවරුන්ගේ හිමිකම් පනතේ 3(2) වගන්තිය	රාජ්‍ය අමාත්‍යවරියක් සඳහා අදාල අමාත්‍යාංශයෙන් අනුමත වාහන සංඛ්‍යාව ලබාදී තිබියදී ජනාධිපති ලේකම් කාර්යාලයෙන්ද වාහනයක් ලබාදී තිබුණි. හිටපු ජනාධිපතිවරු හතරදෙනෙකු සඳහා ලබාදිය හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව ඉක්මවා අයෙකුට වාහන 03 සිට 14 දක්වා එකතුව වාහන 38 ක් වැඩිපුර ලබාදී තිබුණි.

3.5 බැඳීම් හා බැරකම්

බැඳීම් හා බැරකම් ප්‍රකාශය (Annexure iii) හා භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත 92 ට අනුව බැඳීම් හා බැරකම් වටිනාකම රු.110,610,455ක් වුවද රජයේ මූල්‍ය ප්‍රකාශනයේ උපලේඛණ iv හි "අතිගරු ජනාධිපති" යන වැය විෂයේ බැඳීම් හා බැරකම් වටිනාකම රු.410,613ක් ලෙස දක්වා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

ජාතික ප්‍රමුඛතාවයන් සඳහා ජාතික මට්ටමේ මගපෙන්වීම සහ සම්බන්ධීකරණය සඳහා දරණ ලද වියදම් පිළිබඳ පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණය (001-2-06-003-2509) යටතේ ව්‍යාපෘති 11,234 ක් අනුමතකර තිබූ අතර 2024 දෙසැම්බර් 31 ට ඉන් ව්‍යාපෘති 3,544ක්

හෙවත් අනුමත ව්‍යාපෘතිවලින් සියයට 32ක් අවලංගුකර තිබුණි. දිස්ත්‍රික්ක පදනමින් අනුමත එම ව්‍යාපෘති වලින් සියයට 50 කට වඩා ව්‍යාපෘති අවලංගුකර තිබූ දිස්ත්‍රික්ක පිළිබඳ විස්තර පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	අවලංගු කළ ව්‍යාපෘති සංඛ්‍යාව	අවලංගු කළ ව්‍යාපෘති සංඛ්‍යාව අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%)
ගම්පහ	182	112	62
කළුතර	75	58	77
නුවර එළිය	26	14	54
හම්බන්තොට	105	66	63
කිලිනොච්චිය	04	02	50
කුරුණෑගල	1448	1191	82
පුත්තලම	273	164	60

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා අනුව සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ හා අධීක්ෂණය සඳහා මූලතිව් දිස්ත්‍රික්කයේ අනුමත ප්‍රතිපාදන රු. 24,572,787 ක්වූ ව්‍යාපෘති 04 ක වැඩ ආරම්භ කර අත්හිටුවා තිබුණි.

(ඇ) සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණය සඳහා 2024 වර්ෂයේදී සංවර්ධන කාර්යක් සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදුන් එකතුව රු.60,000,000ක ප්‍රතිපාදනයෙන් 2024 දෙසැම්බර් 31 දිනට කිසිදු කාර්යයක් සිදු නොකර සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතිරිවී තිබුණි.

(ඈ) වතුකරයේ ජනතාවට ඉඩම් අයිතිය ලබාදීම (වැය විෂය 001-2-06-022-2509) සඳහා වූ 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගති සාරාංශය අනුව දිස්ත්‍රික්ක හයක අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 61ත් 86ත් අතර පරාසයකින් ව්‍යාපෘති 748ක වැඩ අවසන් කර නොතිබුණි.

(ඉ) දිස්ත්‍රික්ක 09ක වතුකරයේ ජනතාවගේ ඉඩම් අයිතිය ලබාදීම සඳහා වූ රු.1,042,150,000ක ප්‍රතිපාදන වලින් රු.803,391,693ක් හෙවත් සියයට 50 ක් ඉක්මවා ප්‍රතිපාදන වියදම් නොකර ඉතිරිවී තිබුණි.

(ඊ) තරුණ අභිවෘද්ධි වැඩසටහන (වැය විෂය 001-2-06-29-2504) යටතේ අනුරාධපුර හා රත්නපුර දිස්ත්‍රික්ක සඳහා අනුමත වී තිබූ ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් කර නොතිබුණි. ඒ සඳහා පිළිවෙලින් රු.මි.25.4ක් සහ 2.45ක් ප්‍රතිපාදන අනුමත කර තිබුණි.

(උ) තරුණ අභිවෘද්ධි වැඩසටහන සඳහා අමිපාර දිස්ත්‍රික්කයේ අනුමත ව්‍යාපෘති 248න් ව්‍යාපෘතීන් 156ක් හෙවත් අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 63ක වැඩ අවසන් කර නොතිබුණි.

(ඌ) තරුණ අභිවෘද්ධි වැඩසටහන සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයට අනුමත ව්‍යාපෘති නොතිබුණ ද එම දිස්ත්‍රික්කය සඳහා රු.මි.29ක ප්‍රතිපාදන ලබාදී රු.මි.0.335ක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ හා ක්‍රීඩා උපකරණ ලබාගැනීමට පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා දරා තිබුණි. තරුණ අභිවෘද්ධිය සඳහා කිසිදු මුදලක් යොදවා නොතිබුණි.

(එ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04කට ලබාදී තිබූ එකතුව රු.58,354,990 ක ප්‍රතිපාදන වලින් කිසිදු තරුණ අභිවෘද්ධි වැඩසටහනක් සිදු නොකර සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතිරිවී තිබුණි.

(ඒ) තරුණ අභිවෘද්ධිය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 03කට හා තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශයට ලබාදී තිබූ රු.487,780,420ක ප්‍රතිපාදන වලින් රු.385,919,466ක් හෙවත් සියයට 50ක් ඉක්මවා වියදම් නොකර ඉතිරිව පැවතුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) සංවර්ධන වැඩසටහන් සඳහා ජාතික ප්‍රමුඛතාවයන් සඳහා ජාතික මට්ටමේ මහපෙන්වීම සහ සම්බන්ධීකරණ වැය විෂයේ සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු අනුමත කර මාස හතරක කෙටි කාලයක් තුල නැවත පරිපූරක ඇස්තමේන්තු මඟින් විමධ්‍යගත අයවැය හා සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ අධීක්ෂණය යන වැය විෂයයන් සඳහා පිළිවෙලින් රු.2,000,000,000 ක් හා රු.1,000,000,000ක් ප්‍රතිපදානද පාර්ලිමේන්තු අතිරේක ප්‍රතිපාදන ඇස්තමේන්තු මඟින් නැවත රු.8,750,000,000ක ප්‍රතිපාදන ද සලසාගෙන තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී මෙම වැය විෂයයන් දෙකට අදාලව පිළිවෙලින් රු.1,092,455,816 ක හා රු.4,473,914,720 ක ප්‍රතිපාදන වියදම් නොකර ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 08ක් හා 44ක මට්ටමක පැවතුණි.

(ආ) සංවර්ධනය සඳහා ලබාදුන් ප්‍රතිපාදන මුදල් වියදම් නොකර ඉතිරිවී තිබීම සහ ප්‍රතිපාදන ලබාදුන් සංවර්ධන ව්‍යාපෘතිවල ඉදිකිරීම් පිළිබඳ අධීක්ෂණයක් හා විමර්ශනයක් සිදුකර ප්‍රතිපාදන මුදල් කාර්යක්ෂමව හා ඵලදායිව සංවර්ධන කටයුතු වෙනුවෙන් යොදවා ගැනීම

හෝ භාවිතා නොකරන ලද මුදල් වෙනත් සංවර්ධන කටයුත්තක් සඳහා හෝ යොමුකර නොතිබුණි.

4.1.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

ජනාධිපති කාර්යාලයේ වියදම් ඇස්තමේන්තු තුල ජනාධිපති අරමුදලේ කාර්යයන් සඳහා වැය විෂයක් නොමැති වුවද, සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ ස්ථිර හා තාවකාලික කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.47,373,717 ක්, පරිපාලන වියදම් ලෙස රු.16,490 ක්, නඩත්තු වියදම් රු.963,808ක් සහ අනෙකුත් වියදම් ලෙස රු.2,774,063ක් ලෙස එකතුව රු.51,128,078ක් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) ජනාධිපති කාර්යාලය නමින් ලියාපදිංචි කර ඇති නමුත් භෞතික පැවැත්ම තහවුරු කරගත නොහැකි වූ වාහන 29 ක් පැවැතුණි. මෙම වාහන අතුරුදහන් වීම හෝ කිසියම් ආයතනයකට / පුද්ගලයෙකුට භාරදුන් බවට හෝ කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2024 වර්ෂය තුලදී ජනාධිපති කාර්යාලයේ වාහන අලුත්වැඩියාව සඳහා දරණ ලද සමස්ථ වියදම රු.645,336,774ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදී එකම වාහනය අලුත්වැඩියා වාර 10 සිට 17 දක්වා වූ පරාසයක් තුල අලුත්වැඩියා කිරීම් අවස්ථා 53 ක් නිරීක්ෂණය විය. තවද, විගණනය වෙත ලැබී ඇති තොරතුරු අනුව, රු. මිලියනය 1- 40 අතර වටිනාකමින් යුතු වාහන 189ක් සඳහා 2024 වර්ෂය තුලදී වාහනයකට සඳහා රු.මිලියන 01-28ක් දක්වා පරාසයකින් අලුත්වැඩියා කිරීම සඳහා වියදම් දරා තිබුණි.

(ඇ) මු.රෙ.104(4) ප්‍රකාරව අලාභ හානිය සිදුවූ (නැතහොත් ඒ බව දැනගත්) දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද 2023 සහ 2024 වර්ෂයන් වලදී වාහන අනතුරු 05ක් සම්බන්ධයෙන් ගිණුම් වර්ෂය අවසාන වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඈ) 2024 වර්ෂයේදී ජනාධිපති කාර්යාලය විසින් වෙනත් පාර්ශවයන් වෙත පවරා දී ඇති වාහන 22ක් ජනාධිපති ලේකම් කාර්යලයේ වාහන ලැයිස්තුවෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වාහන 14ක් සම්බන්ධයෙන් ලියාපදිංචි සහතිකවල මුල් පිටපත් අස්ථානගත වීම හේතුවෙන් අනු පිටපත් ලබාගෙන තිබුණි.

(ඊ) 2022 අගෝස්තු 03 දිනැති විධායක නියෝගයට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රී / මහජන නියෝජිතවරිය වෙත ලබාදී 2024 සැප්තැම්බර් 21 දිනට පසුව ආපසු කාර්යාලයට භාරදී තිබූ වාහන 06කට ආපසු භාරදෙන අවස්ථාව වන විට සිදුවී තිබූ අනතුරු පිළිබඳව පොලිසියට, රක්ෂණ නියෝජිතයන්ට සහ ජනාධිපති කාර්යාලයේ ප්‍රවාහන අංශය වෙත වාර්තා කර නොතිබුණි.

(උ) විවිධ පාර්ශව විසින් භාවිතා කළ ජනාධිපති ලේකම් කාර්යාලය සතු වාහන 107 ක් 2024 සැප්තැම්බර් 21 දිනට පසුව ආපසු භාරදී තිබුණි. මෙහිදී, ආපසු භාරදුන් දිනය හා භාරදුන් හා භාරගත් පුද්ගලයන්ගේ විස්තර නොමැති වාහන 04ක්ද, අලාභ හානි සිදුවී රක්ෂණ ක්‍රියාමාර්ග නොගත් වාහන 07ක්ද, වාහන සමඟ ආදායම් බලපත්‍ර ලබා නොදුන් වාහන 06ක්ද තිබුණි. 2023 ජනවාරි 01 සිට 2024 සැප්තැම්බර් 21 දක්වා උක්ත වාහන 107 සඳහා අලුත්වැඩියා හා නඩත්තු වෙනුවෙන් රු.141,831,832ක වියදමක් කාර්යාලය විසින් දරා තිබුණි.

(ඌ) කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට දී තිබූ මොටර් රථයක් 2022 මැයි 09 දින අරගලය හේතුවෙන් සම්පූර්ණයෙන් ගින්නෙන් විනාශ වී තිබුණි. මේ පිළිබඳව පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග කරමින් පවතී. වාහනය මන්ත්‍රීවරයාට භාරදෙන ලද දිනය, වාහනය භාරදීම හා භාර ගැනීම, වාහනය භාවිතාය පිළිබඳ සාක්ෂි විගණනයට අනාවරණය නොවුණි. අලාභය පිළිබඳව මු.රෙ.103(1)(අ)ට අනුව පොලිස් වාර්තා ලබාගෙන ඇතිබවට තහවුරු නොවූ අතර අනතුරට අදාලව රක්ෂණ වන්දිය ලබාඇනීමට කාර්යාලය මේ දක්වා අපොහොසත්වී තිබුණි.

(එ) ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් අයිතිය පවරා දීමේ පදනමින් ආරක්ෂක අමාත්‍යාංශයට වාහන 03ක්ද යුද්ධ හමුදාවට වාහන 09ක්ද ලබා දී තිබූ නමුත් අදාල ආයතන විසින් විගණනයට ලබාදුන් තොරතුරු අනුව ආරක්ෂක අමාත්‍යාංශය වෙත වාහන ලබා දී නොමැති බවත් යුද්ධ හමුදාවට එක් වාහනයක් පමණක් ලැබී ඇති බවත් තහවුරු කර තිබුණි. ඒ අනුව, වාහන 11ක් අස්ථානගත වී ඇති බවට විගණනයේදී නිරීක්ෂණය වූ අතර කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව ආරක්ෂක අමාත්‍යාංශයට ලබාදුන් බවට දක්වා ඇති වාහන 07ක් කොස්ගම ශාලාව යුධ හමුදා කඳවුරේ ඇතිවූ ගින්නකින් විනාශවී ඇති බවද නව වාහනයක් අපහරණය කර බාහිර පාර්ශවයකට විකුණා ඇති බවත් දක්වා ඇතත් එම වාහන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ජනාධිපති මන්දිර 08ක් සඳහා 2024 වර්ෂය තුලදී නඩත්තු වියදම රු.80,154,422 ක් දරා තිබුණි. මෙම මන්දිර වල ආරක්ෂක අංශ නිලධාරීන් 392ක්ද සිවිල් සේවකයන් 16ක්ද සේවයේ යෙදී තිබුණි. සිවිල් සේවකයින් 16 දෙනෙකු සඳහා රු.13,741,080ක වැටුප් හා දීමනා සමාලෝචිත වර්ෂය තුලදී කාර්යාලය විසින් දරා තිබුණි.

4.3 පාඩු හා හානි

(අ) මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම් (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු 2023 හා 2024 වර්ෂයන්ට අදාල රු.25,000ට වඩා අඩු සිද්ධීන් 53ක එකතුව රු.830,240ක් සහ රු.25.000ට වඩා වැඩි සිද්ධීන් 251ක එකතුව රු.57,337,571ක් ලෙස දක්වා තිබුණි.

(ආ) පොත්වලින් කපා හැර හෝ ගොනු අවසන් කර තිබූ වාහන 136ක රු.20,802,525 ක්වූ අලාභ හානි වටිනාකම පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ ඇමුණුම (i)හි තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනයේ සටහන් කර තිබුණි.

(ඇ) රු.25,000ට වඩා වැඩි අලාභ හානි නැවත අයකරගත් අවස්ථා 224ක වටිනාකම රු.46,887,180ක් සහ රු.25,000ට වඩා අඩු අවස්ථා 41ක වටිනාකම රු.720,667 ක් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (i)හි දක්වා තිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) රජයේ ඇපකාරක සංගමය සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සම්බන්ධකර ගනිමින් ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනා ගැනීම හා තැබිය යුතු ඇප ප්‍රමාණය තීරණය කිරීමේ කටයුතු මානව සම්පත් කළමනාකරණ අංශය විසින් සිදු කරමින් පවතින බවට පසුගිය වර්ෂවල විගණන වීමසුම් වලට පිළිතුරු ලෙස දක්වා තිබුණද, විගණන දිනය 2025 මැයි 31 වන විටත් අදාල කාර්යය අවසන් කර නොතිබුණි.

(ආ) ජනාධිපති කාර්යාලයේ සේවය කර සේවය අතහැරගොස් ඇති නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.974,247ක් වසර 01ත් 20ත් අතර කාලයක් තුල අයනොවී පවතී.

(ඇ) ජනාධිපති කාර්යාලය සතු වාහන 37 ක් මන්ත්‍රීවරුන්ට ලබාදී තිබූ අතර එසේ ලබාදීම සඳහා මන්ත්‍රීවරුන් තෝරා ගත් පදනම හෝ තෝරා ගැනීමට හේතු වූ කරුණු විගණනයට අනාවරණය නොවුණි.

(ඈ) කාර්යාලය සතු වාහන 105 ක් වෙනත් රාජ්‍ය ආයතන හෝ වෙනත් පාර්ශවයන් වෙත නිදහස් කර තිබුණි.

විස්තරය	වාහන සංඛ්‍යාව
ජාතික සවිය ව්‍යාපෘතිය යටතේ විහාරස්ථාන වෙත නිකුත් කර අදාල විහාරස්ථාන වෙත පවරා ගැනීමට බුද්ධ ශාසන අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදී තිබූ වාහන	57
වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආරක්ෂක අංශ, වෙහෙර විහාරස්ථාන සහ කාර්මික විද්‍යාල සඳහා පවරා ගැනීමට උපදෙස් ලබාදී තිබූ කාර්යාලය සතු වාහන	48

	105

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබූ වාහන 27ක් තවදුරටත් ජනාධිපති කාර්යාලය සතු වාහන ලැයිස්තුවේ දක්වා තිබුණි.

(ii) 2017 වර්ෂයේ සිට වසර 07 ක් ගතවී ඇතත් පැවරුම් කටයුතු අවසන් නොකිරීම නිසා තවදුරටත් නිදහස් වාර්ෂිකව බලපත්‍ර ලබාගැනීම හේතුවෙන් රජයට බලපත්‍ර ආදායම් අහිමි වීමත් වාහන අවභාවිතා කිරීමක් සිදු වුවහොත් ඒ පිළිබඳව වගකීමට කාර්යාලයට සිදුවීමේ අවධානමක් පවතී.

(ඉ) වාහන අපහරණයකිරීමකින් තොරව විහාරස්ථානය වෙත 2019 වර්ෂයේදී වාහන 05ක් ලබාදී තිබුණද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව ඒවා තවදුරටත් ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචිව තිබුණි.

4.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) විශේෂ ව්‍යාපෘති අංශයේ රාජකාරි කටයුතු සඳහා කාර්යාලය විසින් බෙන්ස් රථයක් ලබාදී තිබූ අතර ප්‍රවාහන අංශයේ වාර්තා අනුව මෙම රථය ඉන්ධන ලීටරයකින් 6 km ක් ධාවනය කළ හැකිය. 2022 නොවැම්බර් සිට 2024 සැප්තැම්බර් දක්වා මෙම රථය 30,689km ධාවනය කර තිබූ අතර ඒ අනුව ඒ සඳහා සඳහා ආසන්න වශයෙන් ඉන්ධන

ලීටර් 5,150 ක් පමණ අවශ්‍ය වුවද, කාර්යාලයේ ඉන්ධන කුපන්පත් භාවිතා කරමින් මෙම රථයට ඉනධන ලීටර් 7,425ක් එනම් සාමාන්‍ය අවශ්‍යතාවයට වඩා ලීටර 2,300 කට වඩාවැඩිපුර ලබාගෙන තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී කාර්යාලය විසින් හිටපු ජනාධිපතිවරයෙකුගේ භාවිතය සඳහා විදේශ සැපයුම් කරුවෙකුගෙන් Mercedes Benz G63 AMG මාදිලියේ රථයක් මිලදී ගෙන තිබූ අතර මෙම මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ බවට තහවුරු නොවූ අතර කාර්යාලය විසින් මේ සඳහා බ්‍රිතාන්ය සැපයුම්කරුට 2013 නොවැම්බර් 14 ණයවර ලිපි මඟින් රු.16,489,711 ක් ප්‍රේෂණය කර තිබුණි. මීට අතිරේකව, 2014 මාර්තු 07 හා මැයි 09 දින වලදී පෞද්ගලික පාර්ශවයක් වෙතද නැවත රු.16,250,000ක් ගෙවා තිබූ අතර අදාල පෞද්ගලික පාර්ශවය විසින් එම මුදල විදේශ සැපයුම්කරුට ගාස්තු වශයෙන් ගෙවූ බව දන්වා තිබුණද එසේ ගෙවූ බවට තහවුරු නොවූ අතර ණයවර ලිපි කාර්යාලය විසින් විවෘත කර තිබියදී රජයේ මුදල් තෙවන පාර්ශවයකට ගෙවීම සඳහා පදනම විගණනයේදී අනාවරණය නොවුණි.

එම පෞද්ගලික පාර්ශවය විසින් මෙම මෝටර් රථය ආනයනය කර කාර්යාලයට ලබාදුන් බවට තහවුරු නොවූ අතර 2013 නොවැම්බර් 21 කාර්යාලයට ලැබී තිබූ රථය 2019 දෙසැම්බර් 10, එනම් වසර හයකට පසුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි. මෙම රථයට ආනයන රේගු බදු රු.45,982,438 ක් නිදහස්කර ගැනීම සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන ඇති බවට තහවුරු නොවූ අතර ගෙවීම්වලට අදාළ වූ ගෙවීම් වවුචර් පත් හා අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2024 සැප්තැම්බර් 01 දක්වා වසර 11 ක කාලයක් තුළ මෙම රථය කිලෝමීටර් 49,950 ක් පමණක් ධාවනය කර තිබූ අතර, විගණනයට ලද තොරතුරු අනුව, අළුත්වැඩියා, නඩත්තු හා වාර සේවා වියදම් ලෙස එම කාලය තුළ එකතුව රු.14,504,794 ක් දරා තිබුණි.

ඩී.ජී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට



Presidential Secretariat
Colombo 01, Sri Lanka
Tel : 0112 354 354/ 0114 354 354 | Fax : 0112 340 340 | Email: ps@presidentsoffice.lk

Department of Government Printing, Sri Lanka.